# ශක්තිය

පොදු ජන හඬේ දෝංකාරය


## ප්‍රතිත්‍රස්ත පනත අකුලා ගනු!

**විපක්ෂයෙන් ආණ්ඩුවට බලපෑම්...**

08 පිටුවට


තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලදි : QD/05/NEWS/2019

වෙළුම : 17 | කලාපය : 03 | අන්තර්ජාල ලිපිනය - www.shakthiya.org | 2019 මැයි | මිල රුපියල් 30.00යි.




**පූජිත බේරනවාට රනිල්ට එජාපයෙන්ම චෝදනා**

# රනිල්ගේ දෙකොන ඇවිලෙයි...

## කාදිනල් හිමිගේ ආගමික මෙහෙයුමෙන් හා මෛත්‍රීගේ ආරක්ෂක මෙහෙයුමෙන්

# රනිල් අනාථයි...





**සරත් පතිරන**

ත්‍රස්ත ප්‍රහාරයෙන් පසුව මේ රටේ ත්‍රිවිධ හමුදාව හා පොලිසිය මෙන්ම බුද්ධි අංශවල ඒකාබද්ධ මෙහෙයුම් සාර්ථක වීම හා කාදිනල් හිමිගේ ආගමික මෙහයුම සාර්ථක වීමත් තුල ඇතිවෙන්නට ගිය මහා ලේ වැගිරීම වැළැකුනු නිසා අගමැති රනිල් වික්‍රමසංහගේ ගේ විදෙස් හමුදා ගෙන්වීමේ සිහිනය බොඳ වී යාමෙන් ඔහු දේශපාලනිකව අනාථ වී සිටින බව දේශපාලන විචාරකයෝ පෙන්වා දෙති. ආරක්ෂක අමාත්‍යවරයා ලෙස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට ත්‍රස්ත ප්‍රහාරය නොවැලැක්වීමේ අසමත්තම පටවන්නට හැදුවද ඔහු දක්ෂ ලෙස ආරක්ෂක අංශ මෙහෙයවාගෙන දෙසතියක් තුළ රටේ තත්ත්වය සාමාන්‍ය අතට පත් කිරීමට සමත් වීම නිසාම රනිල් වික්‍රමසිංහ තම කණ්ඩායම සමඟ බසු බැස තිබේ..

02 පිටුවට

## ත්‍රස්ත ප්‍රහාරයට මුවාවී එජාපය 83 කළු ජූලියට අතවනයි

**සරත් රණසිංහ**

මැරයන් ලවා මේ රටේ අහිංසක මිනිසුන් මරා දැමූ එජාපය 1983 දී ඇති කල කළු ජූලියක් යළි ඇති කරන්නට උත්සාහ කරන බව නිදහස් කලා සන්ධානය චෝදනා කරයි. මුස්ලිම් අන්තවාදීන්ගේ ප්‍රහාරය ජාතිවාදී, ආගම්වාදී, සටනක් දක්වා මෙහෙයවීමට එජාපයේ ප්‍රබලයින් කැස කවන බවටද චෝදනා එල්ලවී තිබේ. පාර්ලිමේන්තුවේ සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල බෞද්ධ විහාරස්ථානවලට යැවීමට සූදානම්කර තිබූ ලිපියද මෙම උත්සාහයේ එක් පියවරක් බවද සඳහන් වේ.මේ අතර රාජිත සේනාරත්න අමාත්‍යවරයා ඉකුත්දා සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයට ගෝඨාභය, ගම්මන්පිල, හා විමල් වීරවංශ සම්බන්ධ බවට චෝදනා එල්ල කරමින් රට තුළ මිනීමැරුම් ලේ වැගිරීම් ඇතිකර රට අරාජික තත්වයට ඇද දැමීමට සූදානම් වන බවට ද චෝදනා එල්ල වී ඇත.

## ඇමරිකාවේ කුමන්ත්‍රණය හෙලිවෙයි

මෙරට රාජ්‍ය සේවකයින් අධිකරණ විනිසුරුවන් හා ආරක්ෂක අංශ වල සාමාජිකයින්ට අමෙරිකාවේදී වෘත්තිය පුහුණු අවස්ථා ලබා දී ඒ හරහා මෙරට ආරක්ෂාවටත්, අධිකරණයටත්, රාජ්‍ය පරිපාලනයටත් බලපෑම් කිරීමේ ඇමරිකන් කුමන්ත්‍රණයක් හෙළිදරව් වී තිබේ.

මෙමගින් ඇමරිකාවට ගැති රනිල් වික්‍රමසිංහ රැක ගැනීමත් නැවත මැතිවරණයකට රාජපක්ෂවරුන්ට ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ ඇහිරීමත් ඇමරිකාවේ අරමුණ වී ඇති බව ද සදහන් වේ. ඉකුත් පාස්කු ඉරිදා සිදුවූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය පිටුපස ඇමෙරිකාවේ සෙවනැල්ල ඇති බවද ප්‍රබල සැක මතුකර තිබේ.

**සුජිත් වීරසූරිය**

02 පිටුවට

## භාරකාර ආණ්ඩුවක් පත්කරන්න වාසුදේව ජනපතිට කියයි...

## ලැන්ටි



**කොන්ද පන ඇති නායකයෙක් ඉදිරි ජනාධිපතිවරණයට.** *චම්පික -ජාතිකමග-*

**එහෙනම් පිනුම් අප්පු හදන්නේ ඇමති රක්ෂාව බේරාගන්න වෙන්නැති.**

ලැන්ටි

## අවුරුදු 4,1/2 ට යහපාලන රජයේ ඇමතිවරු 20 කට චෝදනා

**ලලිත් රණවීර**

යහපාලන රජයේ අගමැති ඇතුළු මැති ඇමතිවරුන් සිදුකර ඇති හොරකම්,දූෂණ වංචා,හා රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබද තොරතුරු හා ඒවාට අදාල සාක්ෂි ඒකාබද්ධ විපක්ෂයට ලැබී ඇති බැවින් TOP 20 කම්බා හොරැ නමින් ඒ තොරතුරු හෙලිකරන බව ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්දානන්ද අළුත්ගමගේ මහතා සදහන් කෙළේය.විපක්ෂනායක කාර්යාලයේදී පැවති මාධ්‍ය හමුවකදි ඔහු පෙන්වා දුන්නේ වංචා දූෂණ හොරකම් තුරන්කිරීමට කියමින් බලයට පැමිණි යහපාලන ආණ්ඩුවේ අගමැති හා ඇමතිවරු කම්බා හොරු බවට පත්ව ඇති බවය.

02 පිටුවට

ශක්තිය
— පොදු ජන හඬේ දෝංකාරය —
49/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස්/ දුරකථන: 0112684820
විද්‍යුත් තැපැල: Shakthiya85@gmail.com
වෙබ් අඩවිය: www.shakthiya.org

# ජනාධිපතිවරයාගේ නොසැලෙන අධිෂ්ඨානය ආදර්ශයකි

ජනාධිපති ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් පසු ජනාධිපතිවරුන් සියලු දෙනාටම ත්‍රස්තවාදයට මුහුණදීමට සිදු බව මෑතදී මෛත්‍රීපාල ජනපති මතක් කලේය. ජනපති ජේ.ආර්. පාර්ලිමේන්තුව තුල ජ.වි.පෙ. ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයෙන් බේරුනේ අනුනවයෙනි.

ජනපති ආර්.ප්‍රේමදාස අවසන් ගමන් ගියේ ආමර්වීදියේදී එල්.ටී.ටී.යේ බාබුගේ ත්‍රස්ත පුපුරුවා ගැනීමකිනි. කෙටිකලක් තනතුර හෙබවූ තෙවැන්නා වූ ජනපති විජේතුංග ත්‍රස්තවාදයේ ගොදුරක් නොවී විශ්‍රාම ගත්තේය. යූ.ඇන්.පි.යෙන් ජනාධිපතිවරණයට සූදානම් කල ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක යන දෙදෙනාම තනතුරු නොලබා වේදිකා මතදීම ත්‍රස්තවාද වින්දිතයන් විය. සිව්වන ජනපතිනිය වූ චන්ද්‍රිකා මහත්මිය ත්‍රස්ත ප්‍රහාරයකින් ඇසක් අහිමිව විශ්‍රාම ගියාය.

පස්වෙනි ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 30 අවුරුදු යුද්ධය නිමාකර, මුළුරට එක්සත් කලේය. ප්‍රභාකරන්ගේ ත්‍රස්ත භීතිය අවසන් කර, ජනතාවට සාමය උදාකර දුන්නේය. මහින්ද ජනපතිගේ මයිල් ගසකටවත් අනතුරක් සිදු නොවූයේ ආරක්ෂක ලේකම් හා හමුදාවන් අනතුරට මුහුණ දෙමින් රට රැකීමට දැක්වූ අභීත වික්‍රමයන් නිසාය. ත්‍රස්ත ප්‍රහාරයකට ලක් නොවී වැඩිම කලක් ජනපති තනතුරේ රැදී සිටි ජනප්‍රිය ජනපතිවරයා ලෙස මහින්ද තැබූ වාර්තාවද කිසිවෙකුටත් තවම බිඳහෙලිය නොහැකි විය.

යූ.ඇන්.පි.ය පිලිමතලාවගේ න්‍යායෙන් හයවෙනි ජනාධිපතිවරයා ලෙස මෛත්‍රී පත් කර ගත්තේ කඩිනමින් ඔහු පෙරලාදමා සම්පූර්ණ බලය රනිල් වෙත පවරා ගැනීමටය. මෛත්‍රීපාල ජනපති දිගුකාලීන මිතුරු දි.මු. අගමැති ඇතුලු ඇමති මණ්ඩලයද, මවුලානා ඇතුලු ආණ්ඩුකාරවරු පමණක් නොව අගවිනිසුරුද ඉවත් කලේ නීතියට හා සම්ප්‍රදායට පටහැනිවූ අධිෂ්ඨානයකිනි. කිසිදා ඡන්දයක් දිනා ලබාගත නොහැකි අගමැති තනතුර රනිල්ට පවරා දුන්නේ එදා පැවති සන්ධර්භය තුලය. ජාතිකවාදීන්, වාමාංශිකයින් හා ප්‍රජාතන්ත්‍රවාදීන් එක්ව නුගේගොඩින් ඇරඹුන මහින්ද සුළඟ මැදමුලනට හමා යමින් විකල්ප බලයක් ලෙස ඉදිරියට පැමිණියත්, ඉන්පසු මෛත්‍රී සමඟ මහ මැතිවරණයේදී ඇතිකර ගත් නොමේරූ එකඟත්වය අතරමගදී ගබ්සා විය.

රනිල් ඇතුලු යූ.ඇන්.පී. නඩය මහබැංකුව කොල්ල කමින් ජාතික සම්පත් වනසමින්, විදේශික ආධිපත්‍යයකට රට යටපත් කිරීම ගැන හදවතින්ම ශෝකී වූ ජනපති මෛත්‍රීපාල තමා හොර මුලකට කොටුවූ බව ජනතාවට දැනුම් දුන්නේ මීලඟ පියවර ගැන අධිෂ්ඨානයෙනි. පළාත් පාලන මැතිවරණයේ පොදු ජන පෙරමුණු ජයග්‍රහණයත් සමඟ ප්‍රජාතන්ත්‍රයටත් ජන මතයටත් හිස නැමූ ජනපති මෛත්‍රීපාල යූ.ඇන්.පී. - ශ්‍රී ල.නි.ප. සන්ධානය බිඳ දැමුවේය. එනිසා කුපිතව දිගන සිදුවීම් සමඟ ජනපති ඝාතන කිරීමට යූ.ඇන්.පි.ය හා රාජ්‍ය නිලධාරින් එක්වූ සැලසුම රටට හෙලිවිය. එවිට ජනපති මෛත්‍රී කියා සිටියේ ''මම මරණයට නොබියව ජාතික ස්වාධීනත්වයත්, ජනතාවගේ සුභසිද්ධියත් වෙනුවෙන් තීරණ ගන්නවා'' යනුවෙනි. රනිල් අගමැති ඉවත් කර මහින්දට අගමැති බලය පවරා පාර්ලිමේන්තුව විසුරුවා ඡන්දයකට ගමන් කිරීමට අදිටන් කර ගෙන තීරණ ගත්තත් අධිකරණය එයට හරස් වීමෙන් පසුව එලඹුනු ත්‍රස්තවාදී විපතට ලබාදුන් ආශිර්වාදයක් බඳුවිය.

පසුගිය ඔක්තෝබර්යෙන් පසුව රටතුල පැන නැගුණු අරාජිකකත්වයේද හිදැසින් ස්ලාමීය ත්‍රස්තවාදය පැන නැගුනි. එය මැඩපැවැත්වීමට කුපිත වූ නාගයෙක් ලෙස නැගී සිටි මෛත්‍රී ජනාධිපතිවරයා සිය අධිෂ්ඨානය පෙරදැරිකර ගෙන විදේශ බලවේග මෙන්ම රනිල්ගේ දක්ෂිනාංශික බාධකද පරයමින් ජනතාවාදී තීරණ රැසක් ගෙන සතියක් වැනි කෙටි කලක් තුලදී ත්‍රස්තවාදීන් මෙල්ල කලේය.

මෙතැනින් ඉදිරියට අරාජිකව රට ගෙනයා හැකිද? සුළුජාතීන්ගේ කොක්කේ එල්ලී රට ගෙනයා නොහැකිය. ආසියානු කලාපයම නතු කර ගැනීම බටහිර විදේශීක බලවතුන්ගේ සැලැස්ම අනුව රනිල් නව ත්‍රස්ත පනතක් ගෙන එමින් කටයුතු අරඹා තිබේ. ජනතාවට විනකල අගමැති, ත්‍රස්තවාදයට සම්බන්ධ ඇමතිවරු, ජාතික සම්පත් කොල්ලකෑ හොරු රැල, ඝාතන කුමනත්‍රණයට වගකිවය යුතු පොලිස්පති ඇතුලු නිලධාරින් අධිකරණයට පමුනුවීම නව රජයකින් කලයුතුය. එතෙක් කල් නොහැර, විපක්ෂ නායකද අතුලත්වූ රනිල් නොමැති තාවකාලික ආණ්ඩුවක් වහාම පිහිටුවීමද, ජාතික උන්නතිය සඳහා බලතල සහිත සර්ව ආගමික පාලක සභාවක් පත් කිරීම අවශ්‍යය. තවද, රට යථාතත්වයට පත්කර, කඩිනමින් මැතිවරණ පවත්වා ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම පොදු ජනතාවගේ සහය ලබන ජනපතිගේ මීලඟ අධිෂ්ඨානය විය යුතුය.

# කළු හෙවනැල්ලේ රතු තරුව

**ඇමරිකාවේ කළු හෙවනැල්ලේ රතු තරුව හෙවත් ඇලෙක්සැන්ඩ්‍රියා ඔකැසියෝ කෝටෙස් වූ කලී ඇමරිකාවේ දේශපාලනයේ මෑත ඉතිහාසයේ උඩුයටිකුරු කරවූ සුන්දර යුවතියකි**.



ඇය ඇමරිකාවේ ඉතිහාසයේ ලාබාලතම මන්ත්‍රීවරිය ද වේ. කම්මුලේ වලගැසී මුවෙන් නිතර නැගුනු සිනහවට දෙකම්මුලේ වලගැසුනු සුන්දරබව ද තියුනු දෙඇස් ද පළල් ඇහිබැම් ද ඇගේ නිර්භීතභාවයත්, අව්‍යාජභාවයත් නිව්යෝක් 14 වන දිස්ත්‍රික්කයේ වැසියන් තම වසඟයට ගත්තා දැයි සැක සිතෙන තරමටම ඇය විජයග්‍රහණය කළාය.

තම ඇමරිකානු පියාටත් ස්පාඤ්ඤ මවටත් දාව 1989 උපත ලද ඇය නිරායාසයෙන්ම ස්වකීය තම පරම අයිතිය වෙනුවෙන් පවසන්නේ අති ස්වදේශිකයන් බවය. ඇයගේ ප්‍රතිවාදී වසරක අත්දැකීම් ඇති ජෝකරෝලිස් තුට්ටුවකට මායිම් නොකොට ඔහුව පරදන්නේ ද ඒ අභිමානයෙනි.ඇය ඇයගේ දේශපාලන න්‍යාය සිය පරමාදර්ශය කරගන්නේ ද ඒ අනුවමය. ඇය ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික චින්තනය ගුරු කොට එහි අවැසි සටන් පාඨ මෙන්ම ක්‍රමෝපාය ද තම ඡන්ද ව්‍යාපාරයට ගලගපා ගත්තේය. ඇය ස්වදේශිකත්වය තුළ සියටැල් ආදී ස්වදේශිකයන්ද නැවත ඇමරිකාව තුළ ජීවමාන කර ඇත. ඇමරිකාවේ නීල හරිත ව්‍යාපාරය මෙන්ම නිදහස් සෞඛ්‍යය, අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව සුභසාධනය හා ඩොලර් මිලියන 100 ක් ඉක්මවන ධනපතීන්ගෙන් 70% පමණ අධික බදු ලබා ගැනීම ආදී කාරණා හේතුකොටගෙන ජීවන ගැටළු උපරිමයක් වූ තම ඡන්දදායකයාට ඇය දේව දූතියක බඳු විය. තම පියාගේ වියෝවෙන් විද්‍යා උපාධිය වෙනුවෙන් හෝටල් වේටර්වරියක ලෙස සේවය කළ ඇය කිසිදු දේශපාලන නෑකමකට හෝ පරම්පරාවකට උරුමකම් නොකීම විශේෂත්වයකි. මධ්‍යම පාංතිකයන් හා ඊට පහල මිනිසුන්ගේ දුක හඳුනා ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදය වෙනුවෙන් ඇමරිකාවේ ඇති උද්දමනයෙහි හිස්තැනට විසඳුම් සොයමින් තම සටන් ව්‍යාපාරය දියත්කොට සිටී.

ස්වදේශිකත්වය ගුරුකොට ගන්නා සේම ඇමරිකාවේ ඇති ප්‍රජාතන්ත්‍රවාදයද කියුබාව වැනි රටක සමාජවාදී න්‍යායද ඇය තම ආධිපත්‍යය පතුරන ආකාරයෙන් තෝරුම්ගත හැකිය. . ඇමරිකාව වැනි අධිරාජ්‍යවාදී මර්මස්ථානයක සිට ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජවාදය ලෝක රාජ්‍යයක් හැටියට බිහිකිරීමට සැරසීම පවා අප මුසපත් කරන්නේය. ඇලෙක්සැන්ඩ්‍රියා වැනි රතු තරුවක් ඇමරිකාවේ දිනවීම ලෝකයේ යහපත් අනාගතයක සේයාවන් මතුකරයි.

(ජනමාධ්‍ය හා අන්තර්ජාලය ඇසුරෙනි.)

**ජනබන්දු සේනානායක**

# පලමු පිටුවෙන්...

## ත්‍රස්ත ප්‍රහාරයෙන්...

මෙම ත්‍රස්ත ප්‍රහාරයේ තොරතුරු වසන් කිරීමේ චෝදනාව මත පොලිස්පති පූජිත ජයසුන්දර අනිවර්ය නිවාඩු යැවීම ජනපති මෛත්‍රීපාල සිරිසේන කල වැරැද්දක් බව මතුකර පෙන්වීමට රනිල් ගත් උත්සහයට ඔහුගේම කණ්ඩායමෙන් විරෝධය එල්ල වීම නිසා රනිල් දෙකොන ගිනිගෙන දැවෙන විලක්කුවක තත්ත්වයට ඇදවැටී ඇත.මේ නිසා රජය කෙරේ ජනතා විශ්වාසය බරපතල අර්බුදයකට පත්වී තිබෙන බව එජාප පසුපෙලින් රනිල්ට චෝදනා එල්ල වී ඇත.

මේ තත්වය ඉදිරි මැතිවරණවලදී එජාපයට බරපතල පරාජයකට මුහුණ දීමට සිදුවන බව දන්නා එජාප ප්‍රබලයින් හා බටහිර අවස්ථාවාදී බලවේග රනිල් - මෛත්‍රී නැවත පූට්ටු කිරීමේ මෙහෙයුමක් ආරම්භ කර ඇති බවද වාර්තා වේ.

## භාරකාර ආණ්ඩුවක්...

ශ්‍රී ලංකාව තුල වර්තමානයේ උද්ගතවී ඇති තත්ත්වයට විසඳුම් සොයා ගැනීමට වහාම භාරකාර ආණ්ඩුවක් පත් කලයුතු බව ඒකාබද්ධ විපක්ෂයේ පාර්ලිමේන්තු මංත්‍රී ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක වාසුදේව නානායක්කාර සහෝදරයා පෙන්වා දෙයි.ජනාධිපතිවරයා හා අගමැතිවරයා අතර පවතින විරසකය හා එකිනෙකට පරස්පර මතවාදයන් සමඟ වත්මන් රජය අර්බුදයකට මුහුණ දී සිටියදී රටේ වර්තමාන ගැටලු වලට විසඳුම් රජයෙන් අපේක්ෂා කල නොහැකි බවද මන්ත්‍රීවරයා පෙන්වා දෙන්නේය.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ඒකාබද්ධ විපක්ෂයේ පක්ෂ නායකයින් සමඟද සාකච්ඡා කර විපක්ෂනායක මහින්ද රාජපක්ෂ මහතාට හා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාට මේ සම්බන්ධයෙන් ලිඛිතව දැනුම් දීමට තමන් බලාපොරොත්තු වන බවද මන්ත්‍රීවරයා මව්බිමට කීවේය.

දැනටමත් අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන් විසින්ද සර්වපාක්ෂික බාරකාර ආණ්ඩුවක් පත්කර රටේ උද්ගත වී ඇති තත්වයට ඉක්මන් විසදුම් ලබා දෙන ලෙස මේ වන විටත් යෝජනා කරඇති බව පෙන්වා දෙන මන්ත්‍රීවරයා සර්වපාක්ෂික හෝ ද්විපාක්ෂික හෝ කුමනාකාර අයුරින් හෝ බාරකාර ආණ්ඩුවක් පිහිටුවා වහා මහ මැතිවරණයක් ප්‍රකාශයට පත්කර රටේ ස්ථාවරභාවයට පත් කල යුතුබවද ඔහු කීවේය.

## යහපාලන රජයේ අගමැති...

වර්ෂ 2016 හා 2017 කාලයේ මේ ආණ්ඩුවේ හොරකම් පිළිබඳව අගමැති ඇතුළු ඇමතිවරු හත් දෙනෙකුට එරෙහිව TOP 10 යටතේ පැමිණිලි ඉදිරිපත් කර ඇති බවද 2017 හා 2018 වර්ෂවල අගමැති ඇතුළු ඇමතිවරු සිදුකර ඇති හොරකම් Top 20 යටතේ ඉදිරි මාස තුන ඇතුලත සතිපතා අල්ලස් හෝ දූෂණ වංචා විමර්ශන කොමිෂම වෙත බාර දිමට කටයුතු කරන බවද අළුත්ගමගේ මන්ත්‍රීවරයා සදහන් කෙළේය.ඒකාබද්ධ විපක්ෂය මේ දක්වා අල්ලස් හෝ දූෂණ වංචා විමර්ශන කොමිෂමට ඉදිරිපත් කර ඇති එකම පැමිණිල්ලක්වත් විභාග කර නොමැති වුවත් මේ රජයේ හොරකම් පිළිබද පැමිණිලි ඔවුන්ට ඉදිරිපත් කරන්නෙ තම රජයක් යටතේ ඒ සියලු පැමිණිලි විභාග කර දඩුවම් ලබාදීමට හැකි වන නිසා බවද මන්ත්‍රීවරයා පෙන්වා දුන්නේය

# තාවකාලික ආණ්ඩුවක් පිහිටුවා මැතිවරණ මාවතකට තල්ලුවේද?

**මෙවර බක් මහ අවුරුද්ද රටපුරා ගෙවී ගියේ නිසොල්මනේය. ආර්ථික අහේනිය සැමට දැනෙන්නට විය. නියඟයද පැතුරිනි. අවුරුදු දිනවල අහස අඳුරු වුවත් වර්ෂාවක් ඇති නොවිනි. ඉන්දියානු සාගරයේ අවපාතයක් නිසා පොනී කුණාටුව ලක්දිවට ආසන්නව හැසිරුනත් එය රටට හානියක් නොකර ඉන්දියාව දෙසට ඇදී ගියේය. එම දිනවල ඇදහැලුන වර්ෂාව ගොවිතැනට ආශිර්වාදයක් විය. බක්මස මුසල පුපුරා යාම සිදු වූයේ මහ පෝය දින ආසන්න පාස්කු ඉරිදාවය. මුළු රටටම එක විට හෙන හතක් පුපුරා ගිය ලෙසකින් කොළඹ, මීගමුව, මඩකලපුව කතෝලික දේවස්ථානවල පුපුරායාමත්, සුපිරි හෝටල් සංකීරණයන් 3 කට බෝම්බ ප්‍රහාර එල්ල වීමත් මෙතෙක් පැවති දස වසරක සාමකාමී සහජීවනය වෙනත් දිසාවකින් ගමන් කිරීම අරඹා ඇත. දේශපාලන පක්ෂ බිමේ පමණක් නොව පොදු ජනතාවතුලද සිදුවී ඇති විනාශය හා අවිනිශ්චිතභාවය කෙසේ නිම කළ හැකිද?**

## වෙලාගත් අරාජිකත්වය

නිදහසින් පසුව ලාංකික සමාජයේ දියුණුවේ ප්‍රධාන හේතු සාධකයක් වූයේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාව හා බහුතර ජනතාවගේ සංස්කෘතික උරුමයයි. එහි අවගමනය ඇරඹුනේ 1978 නව ලිබරල්වාදී ගෝලීයකරණයේ විකෘතීන්ට යටත්වීමට ගත් පාලකයින්ගේ තීරණ නිසාය. 2015 දී මෛත්‍රීපාල ජනාධිපතිවරයා වූ විගස මංගල ඇමරිකාවට ගොස් අත්සන් තැබූ අවමංගල ගිවිසුමේ ප්‍රතිඵල මෙම පුපුරායාම් සමඟ පෙන්නුම් කරයි. ඇමරිකාව මානව හිමිකම් කවුන්සිලයෙන් ඉවත් වූවාට ලංකාවත් සමඟ අත්සන් කළ ගිවිසුමෙන් ඉවත් නොවන්නේ වෙනත් බලාපොරොත්තු ඇතිව බව පොදු ජනතාව දැනගත යුතුය. පසුගිය ඔක්තෝබර් 26න් පසුව ලාංකීය සමාජය අරාජිකත්වය රජ කරන යුගයකට ගමන් කරනු ලැබීය. යහපාලන සභාගය බිඳවැටුනු පසු අන්‍ය ජාතික පක්ෂ සමඟ යූ.ඇන්.පී. ගෙන ගිය සම්මුතිය හොඳින් හෙළිදරව්වීමට පටන් ගැනුනේ පුපුරායාම් දිගහැරෙන විටය. දෙමළ ජාතික සන්ධානයට රටම ගිනිගත්තත් ඔවුන්ට ඕනෑ කර ඇත්තේ උතුරු නැගෙනහිර වෙන් කර තබා ගැනීමේ නව ව්‍යවස්ථාවක්ය. මුස්ලිම් පක්ෂ දෙකේ ක්‍රියාකලාපය එම සමාජයේ පතුලෙන් මතුවූ භයානක ත්‍රස්තවාදයෙන් පෙන්නුම් කරන්නේය. ලාංකිකයින්ගේ විනාශයට පත්වූ ජීවිත වෙනුවෙන් එම පක්ෂ දෙකේ මැතිඇමතිවරුන්ද වගකිව යුතුව ඇත. බහුතර ජනතාවගේ මතවාදයන් දැනහඳුනාගත් මෛත්‍රීපාල වැනි ජනාධිපතිවරයෙක් හා ඔවුන්ගේ සංස්කෘතික විලාශයන් තේරුම්ගත් රංජිත් මැල්කම් කාදිනල් තුමා වැනි ආගමික නායකයෙක් නොසිටින්න රටම එකම ලේ විලක් වනු නොඅනුමානය. ඒනිසා තවදුරටත් රට අවුලෙන් අවුලට පත් නොකර රනිල් අගමැති ධූරයෙන් ඉවත්වී යූ.ඇන්.පී.යේ වුවත් සුදුසු කෙනෙකුට එම වගකීම් පවරා දේශපාලනයෙන් සමු ගැනීම හෝ සමු ගැන්වීමේ කාලපරිච්ඡේදය මතු වෙමින් තිබේ.

## මෛත්‍රී-මහින්ද සන්ධානය

දේශපාලන බිමේ ස්ථාවර දිසාවක් පෙන්නුම් කිරීමට විපක්ෂයට නොහැකිවීම මතුව ඇති අර්බුදයේ තවත් පැතිකඩකි. ඡන්ද නොපවත්වා රට ගෙනයාමට විපක්ෂයෙන් කිසිදු ඉඩක් ලබා නොදිය යුතුව තිබුණත් ඒකාබද්ධ සන්ධානයක් ගොඩනඟා ගැනීම පමා කිරීම නිසා එයින් වැඩි ප්‍රයෝජනය ගනු ලැබුවේ යූ.ඇන්.පී.යේ රනිල්ය. ඔහුගේ සැලැස්ම අනුව ජනාධිපතිවරණයකට ප්‍රථම කිසිදු මැතිවරණයකට ඉඩකඩ ලබා නොදී ගමන් කිරීමේ සැලසුමට විපක්ෂය අනියම් හෝ එකඟතාවයක් දක්වන්නේද යන සැකය දේශපාලන විචාරකයින් මතු කරමින් සිටී. ඇත්තවශයෙන්ම මහින්දගේ නායකත්වය නිසා පොහොට්ටුව බහුතර බලයක් පළාත් පාලන මැතිවරණයේදී පෙන්නුම් කලත් පළාත් සභා ඡන්දය දිනා ගැනීමට එය හිලව් කළ නොහැකිය. නිසි කලට ඡන්දය පැවැත්වීම ජනපති, අගමැති පමණක් නොව විපක්ෂයේද වගකීම වන්නේය. දැනට සිදු වෙමින් ඇත්තේ යූ.ඇන්.පී.ය අන්‍ය ජාතික උවමනාවන් අනුව ගොතා ගත් අශුද්ධ සන්ධානයේ පෙර ගමන්කරු වන රනිල්ගේ මාවතේ විපක්ෂයද ඇදී යමින් පැවතීමය. ඒනිසා පොදු ජනතාව අසරණභාවයට පත් වෙමින් ඇත. තවත් කල් පමා නොකර මැතිවරණ පැවැත්වීමේ උද්ඝෝෂණ පෙරට ගෙනයාම විපක්ෂයේ වගකීම වන්නේය. ත්‍රස්තවාදයට පිලිතුර වන්නේ බියවැදී ගෙවල් තුලට වී නොසිටීම බව විපක්ෂනායක මහින්ද මැතිතුමා දක්වන අදහස් ඉතා වැදගත්ය. ඒ අනුව ඒකාබද්ධ සන්ධානයක් තනා ගැනීමත් මැතිවරණය පවත්වන ලෙසට රට පුරා උද්ඝෝෂනය ඇරඹීම කිරීමත් තවදුරටත් පමා නොවිය යුතුව ඇත.

## ස්ලාමීය ත්‍රස්තවාදය පුපුරායාම

ස්ලාම් ත්‍රස්තවාදය පුපුරා ගියේ අහම්බයෙන් නොවේ. එයට බලපෑ හේතුසාධක අතර ප්‍රමුඛ තැනකට පත්ව ඇත්තේ රටතුල සිදුවූ දේශපාලන අවුල හා ආරක්ෂක ලිහිල් කිරීමය. බොහෝ මුස්ලිම් සංවිධාන ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් ගැන ආරක්ෂක අමාත්‍යාංශයට දන්වා සිටියත් ඒ පිලිබඳව ක්‍රියාත්මක නොවී ඇත්තේ දේශපාලන උවමනා එපාකම් අනුව බව දැන් පැහැදිලි වෙමින් තිබේ. විශේෂයෙන් යූ.ඇන්.පී. ආණ්ඩුවේ බහුතරය පවත්වා ගෙන යාමට මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ සහය ලබා ගැනීමේ අරමුණින් එම අමාත්‍යවරුන්ගේ බලපෑම් අනුව සැකකරුවන් නීතිය හමුවට පැමිණවීම මග හැර ඇති අතර, අත් අඩංගුවට පත් වූ අය පවා මුදාහැරීමට බලපෑම් සිදුවී ඇති ආකාරය කිහිප අවස්ථාවකම හෙලිදරව් වෙමින් තිබේ. රාජ්‍ය දුර්වල කිරීම හා ජාතික ආරක්ෂාව විවර කර තැබීම නව ලිබරල් ආර්ථිකය හා බැඳුනු දේශපාලන පියවරයන්ය. ඒ අනුව ආගමන විගමන නීති ලිහිල් කිරීම, විදේශ මුදල් ලැබීම් පිලිබඳ බුද්ධි විමර්ශනයන් සිදු නොවීම හා ආරක්ෂක බුද්ධි අංශ අඩපන කිරීම පසුගිය කාලය පුරා සිදු කරනු ලැබුවේ විදේශික බලවේගවලට කිසිදු අපහසුවකින් තොරව රටතුල සැරිසරමින් සිත්සේ ගනුදෙනු කළ හැකි ආකාරයට වෙළඳ පොල විවෘත කර තැබීමටය. එයින් සිදු වූයේ අනෙකකි. පහසුවෙන් පැතිර ගිය ව්‍යාපාරය වූයේ මත් ද්‍රව්‍ය ජාවාරමයි. ඒ හා බැඳුනු පාතලය සමාජය වෙලා ගත්තේය. අවි ආයුධ සැරිසැරීම හා ඒවා ආගමික අන්තවාදී උවමනාවන් අනුව යෙදවීමටද එසේ නොමැතිනම් පුද්ගල ආරක්ෂාව සඳහා සංවිධානාත්මකව අවි ආයුධ බෙදා හැර ඇද්ද යන කරුණ පවා තවමත් හරිහැටි එලිදරව් වී නොමැත. රාජ්‍ය දුර්වල වී ජාතික දේහය ඔද්දල්ව තිබෙන විට සාමය හා සංහිඳියාව නාමයෙන්, වෙනත් භාෂා ඉගැන්වීම, අන්තවාදී ආගමික සුභසාධනය ව්‍යාප්ත කිරීම විවිධ නාමයන් මගින් විදේශික බලවේග රටතුලට කිසිදු බාධකයකින් තොරව ඇතුලුවීමද සිදු විය. රජයේ දුර්වලතාවය නිසා ජනතාවට ආරක්ෂාව සපයාදීමට වර්තමාන ආණ්ඩුව අපොහොසත්වී ඇති බව පැහැදිලිය.

## මැයි දිනය තහනම්ද?

ත්‍රස්තවාදී පුපුරායාම් දඩමීමා කරගෙන මැයි දිනය නොපැවැත්වෙන තැනට සියලු දෙනා බිය වැද්දීමට රජය සමත් විය. ඒකාබද්ධ විපක්ෂය මැයි රැලි පෙලපාලි පැවැත්වීම ආරක්ෂක තත්වය අනුව අනතුරුදායක ලෙස සැලකුවක් ක්‍රියාකාරීව මැයි දිනය සැමරිය යුතු බවට අදහස් දැක්වීම් සිදු විය. ඒ අනුව වාමාංශිකයින් එක්වී එන්.එම්.පිළිරුව අසල පුෂ්පෝ පහාරයක් පවත්වා රැස්වීමක්ද පැවැත් වූ අතර, ප්‍ර.වා.පෙ. ද පුෂ්ප උපහාරයක් සිදු කර වෘත්තීය සමිති නායකයින් විසින් කථා පවත්වා එතැන් සිට පෙලපාලියකින් කෝට්ටේ නගර ශාලාව වෙත ගමන් කර එහි පැවති ඒකාබද්ධ විපක්ෂ මැයි රැලියට සහභාගීවීම ද සිදු විය. මෙවර ලංකාවේ පෙලපාලියක් පවත්වා මැයි දිනය සැමරුමක් සිදු කල කීර්තිය වෘත්තීය සමිති ඒකාබද්ධ මධ්‍යස්ථානයටත් ප්‍ර.වා.පෙ.යටත් හිමිවිය.

## තාවකාලික ආණ්ඩුවක්

දේශපාලන පිටිය බෝම්බ පුපුරායාම නිසා අවුල් වී තිබේ. ජනාධිපතිවරණ අපේක්ෂකයා කවුද, එලඹෙන මැතිවරණය කුමක්ද ආදිය යටපත් වෙමින් ජාතික ආරක්ෂාව හා ත්‍රස්තවාදය මැඩපැවැත්වීම හා රට යථා තත්වයට පත් කර ගන්නේ කෙසේද යන කරුණත් ප්‍රමුඛත්වයට පැමිණ ඇත. පුපුරන බෝම්බ සමඟ මැතිවරණ පැවැත්වීමේ අනතුරුදායක තත්වය ගැන අත්දැකීම් එමටය. එනිසා ත්‍රස්තවාදයේ සුලමුල සොයා අවසන් කරන තුරු කුමන ආකාරයේ මැතිවරණයක් වුවත් පැවැත්වීමේ අපහසුතාවයපෙන්වය. නමුත් ඉදිරි සිව් මසක් වැනි කෙටි කාලපරිච්ඡේදයක් තුලදී කුමන හෝ මැතිවරණයක් පැවැත්වීමේ ඉඩකඩ විවරවේ. ඒ දක්වා ගමන් කිරීමටවත් පවතින ආණ්ඩුවට ඉඩක් නොමැත. ඒ නිසා සිදුවිය යුතුව ඇත්තේ විපක්ෂයද ඇතුලත් වූ තාවකාලික ආණ්ඩුවකට බලය පවරාදීමය. ඒහා සමඟ සම්පව කටයුතු කිරීමට අන්තර් ආගමික පාලක සභාවක් පත් කර ගත යුතු අතර එම සභාවේ උපදෙස් අනුව ඉදිරි අණපනත් සම්මත කර ගැනීම, සංහිඳියාව, පාලනය මෙහෙයවා ගැනීම විය යුතුය. මැතිවරණයකින් පසුව ස්ථිර ආණ්ඩුවක් පිහිටුවීමට සියලු දෙනා එක්විය යුතුය. ඒ දිසාවෙන් ජනාධිපතිතුමාද කටයුතු සිදු කලොත් ඉදිරි මාස කීපය අතරතුර රට ස්ථාවර වී ජනතා ප්‍රජාතන්ත්‍රය ශක්තිමත්වී ත්‍රස්තවාදය මුලුනුපුටා දැමිය හැකි වනු ඇත.

**සිරිසුමන විදානපතිරණ**
**2019-05-07**

# ත්‍රස්තවාදී පුපුරායාම ලාංකික ජන

## අධිරාජ්‍යවාදී ත්‍රස්තවාදය පරාජය කරමු

**වයඹ උප ප්‍රධාන සංඝ නායක කුඹල් කඩවල පියනන්ද නාහිමි.**

ජාතිවාදී වැඩසටහන මා 1976 දී මඩකලපුවේ වැඩ හිටිය කාලයේදීත් තිබුණා. බ්‍රිතාන්‍යයන්ගෙන් ඇමරිකාව හරි දක්‍ෂ විදිහට තමන්ට නතුකර ගනිමින් ඔවුන්ගේ ඕනෑ එපාකම් ජාතිවාදය හරහා පාවිච්චි කළා. ඒ වගේම දකුණු ආසියාවේ ඇමරිකාවේ කඳවුර විදිහට ලංකාව තේරා ගත්තා. ඒකට ඔවුන් ජාතිවාදය තමයි එලියට දැම්මේ. ප්‍රභාකරන් හරහා ඒ උවමනාව ඉටුකර ගන්නට තමයි උත්සාහ කළේ. ඒක අද වෙනකොට ව්‍යර්ථ වෙලා. ජාතිවාදය ඇතුලේ හංගලා එලිපිට දේශපාලනය තබාගෙන තමයි මේ අධිරාජ්‍යවාදීන්ගේ උවමනාවන් ඉටු කළේ.

අපේ රටේ පාලකයන්ගේ ක්‍රමය තමයි අධිරාජ්‍යවාදී ගැතිකමට යට වීම. මේකට රටේ පාලකයෝ රටේ පුරවැසියො නන්නත්තාර කරලා තියෙන්නේ. රටේ ඉඩම්, වගා බිම්, සංස්කෘතිය, අධ්‍යාපනය විනාශ කරමින් තමයි ගැතිකම් කරන්නේ. ජාතික වශයෙන් ආර්ථික දේශප්‍රේමීත්වයක් නැතිකම තමයි ඒකෙන් පේන්නේ. රට ගැන හිතවනට වඩා රටේ පාලකයෝ ඇමරකානු න්‍යායපත්‍රයට යමින් ආගම් වලට විරුද්ධව, ස්වදේශිකත්වයට විරුද්ධව වැඩ කරනවා. මානව හිමිකම් වලට මුවා වෙමින් ඒ ගැන කථා කරනවා. ඇමරිකාව මානව හිමිකම් වලින් ඈත් වෙලා. ඔවුන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලයෙන් ඉවත් වෙලා. මානව හිමිකම් උල්ලංඝනය කරනවා. නමුත් අපේ රට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඇතුලත් වෙලා මානව හිමිකම් සඳහා චෝදනා ලබනවා.

අපේ සංස්කෘතියට ගරු කරන්න සමාජයක් හදාගන්න ඕන. ශ්‍රී ලාංකිකයො හැටියට කටයුතු කරන්න අපේ භූමියට ගරු කරන්න අවශ්‍ය වෙනවා. අපිත් භික්‍ෂූන් වහන්සේලා හැටියට ත්‍රස්ථවාදී මූලධර්ම ඇතිකරනවා නම් අපි අදහන ආගමෙනුත් වැඩක් නැහැ.

මේක පකිස්තානය හෝ ඉන්දියාව හෝ නොවෙයි. එහෙම හිතන අය තමයි මේ රටට එරෙහි වෙන්නේ. මේ අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයේ වෙන රටවල් වලටත් මෙම අධිරාජ්‍යවාදීන් ත්‍රස්ථවාදය හරහා තම බලය පතුරවන්න උත්සාහ කළා. ඒකෙන් ශ්‍රේෂ්ඨ නායකයෝ පැට්‍රික් ලුලුම්බා, චාවේස්, යසර් අර්ෆාත් යන අය මේ අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයට අනුව මේ ලෝකයෙන් දිවි සමු දුන්නා. අපේ රටට අවැසි ජාතික දේශපාලනය රටට වගකියන්න පුළුවන්, රටම රටට ගැගපෙන විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්න පුළුවන්, සියළු ආගම් වලට නිසි තැන සලසන්න පුළුවන්, සියළු දෙනාටම නිදහසේ ජීවත් වෙන්න පුළුවන් ජනතා ආණ්ඩුවක් හැදෙන තුරු සහ ඇමරිකාව ප්‍රමුඛ අධිරාජ්‍යවාදීන් ඇඟිලි නොගසන තුරු මේ ජාතිවාදී ගැටුම්, මර උගුල්, ජන සංහාර හැමදාම ලක් දීපය තුළ තියේවි.




යුතුයි. සමාජීය ආර්ථික රටාවක් ගොඩනැගීම රටේ සියළුදෙනා සමගම එකතුව ගොඩනැගිය යුතු බව අවසාන වශයෙන් කිව හැකිය.

## රජය ප්‍රභූ ආරක්ෂාව මිස ජනතාවගේ ආරක්ෂාව බලා නැත...

**මහාචාර්ය සුමනසිරි ලියනගේ**



පසුගිය පාස්කු ඉරිදා ලංකාවේ කවුරුත් නොසිතූ පරිදි හෙණ පාතයක් සේ සිදුවූ මේ ත්‍රස්ථවාදී ප්‍රහාරය හදිසි සිදුවීමක් ලෙස පෙනුනත් මෙය දීර්ඝකාලීන සැළැස්මක ප්‍රතිඵලයක් ලෙස තමයි මා දකින්නේ. කිහිප වතාවක් ඉන්දියාව විසින්න වරින් වර එය පිළිබඳ දැනුවත් කිරීමෙන් එය තහවුරු වෙනවා. ඒ වගේම තුර්කි තානාපති කාර්යාලය පවා මේ පිළිබඳ සැලකොට සිටින බව පෙනී යනවා. ඒ වගේම ශ්‍රී ලංකාවේ මුස්ලිම් සමාජයේ උගතුන් මෙවැනි දෙයක් රට තුළ විය හැකි යැයි රජය දැණුවත් කොට තිබෙනවා. නමුත් රජය විසින් ප්‍රභූ ආරක්‍ෂාව කරගනීමට මුල් වූවා මිස සමස්ථ රටවැසියා ආරක්‍ෂා කරගැනීමට වැඩසටහනක් දියත් කොට නොතිබූ බව පෙනෙන්නට තිබෙනවා. එය ලංකාවේ ආරක්‍ෂාව සම්බන්ධ මූලධර්මයේ බරපතල ප්‍රශ්නයක්. මොකද ආරක්‍ෂාව සමබන්ධව සුසමාදර්ශකය යොමුකොට තිබෙන්නේ සමාජයේ අර කියූ ප්‍රභූ පන්තියට පමණයි. විශේෂයෙන් දේශපාලන ප්‍රභූවරුන්ට පමණි. එය සමස්ථ රටවැසියාගේ ආරක්‍ෂාව සමබන්ධ සුසමාදර්ශකය නොවෙයි. එමනිසා රටේ ආරක්‍ෂාව සම්බන්ධයෙන් බරපතල ගැටළුවක් තිබෙනවා. රටේ ආරක්‍ෂාව වෙනුවෙන් මීට වඩා පළල් වාතාවරණයක් ගොඩනැගිය යුතු වෙනවා. බුද්ධි අංශය, රටේ ආරක්‍ෂක අංශය විසින් රටේ ආරක්‍ෂාව නොසළකාහරිමින් තමයි පසුගිය අවුරුදු 03 04 තුළ ක්‍රියා කළේ. ඒ ගැනත් රජය සැළකිලිමත් විය යුතු වෙනවා.

මේ රටේ ආණ්ඩුකරවන පිරිස් විසින් කුඩා ජාතීන් නොසළකාහරිමින් කටයුතු කර ඇති තත්වය පිළිබඳව. ඔවුන් මුලින්ම සිංහල හා මුස්ලිම් ජන සමාජ අතර විශාල ගැටුම් ඇතිකළා. බේරුවල ගැටුම, මහනුවර දිගන ගැටුම ආදිය. මේ ගැටුම් සම්බන්ධව ලිබරල්වාදීන් අදහස් කළේ එම ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස තමා පාස්කු ඉරිදා ප්‍රහාරය සිදුකළේ කියලා. ඒ නිසා ඔය ප්‍රදේශ වැටලීමේදී පිහි, මන්නා, කඩු අහුවෙනකොට එවැනි අවස්ථාවක් තිබෙන බවත්, දැකගන්නට පුළුවන්. නමුත් විශ්ලේෂණය වැරදි වන්නේ මේ පාස්කු ඉරිදා ඇතිවූ ප්‍රහාරය සැසඳීමේදී සමහර සිවිල් සංවිධානවල නායකයින් සුමන්දිරම් වැනි අය ඒ කාරණයට පක්‍ෂව කථා කරනවා.

දේශීය කාරණා වලින් නෙවෙයි මේ කාරණා දැකිය යුත්තේ, ජාත්‍යන්තරවයි. මේ ප්‍රහාරයේ ලක්‍ෂණ කිහිපයක් අපට දකින්නට ලැබෙනවා. මරාගෙන මැරෙන බෝම්බකරුවන්ගේ ප්‍රහාරයක් ඔවුන් දේශීය ගැටුම් වලට හවුල් වූ අය නොවෙයි. ඔවුන්ගෙන් අපට දැනගන්නට තිබෙන සාම්‍යය තමයි දිගන හෝ බේරුවල තරුණයන්ට වඩා 9/11 ඇමරිකාවට ප්‍රහාරය එල්ල කළ මාරාගෙන මැරෙන අයට ඇති කිට්ටුව. ඔවුන් උගත් මධ්‍යම පාංතිකයිනි. නවීන සමාජයක සකස් වූ කුලකයක අය. ඒ නිසා ලංකාවේ පාස්කු දින ප්‍රහාරය දේශීය ප්‍රශ්නයකට වඩා මා දකින්නේ ජාත්‍යන්තරයට ඔවුන් සමාන ලෙසය. ඒ නිසා මේ කාරණා දෙකක්. දේශීය ගැටුමකුත් රට තුළ තිබෙනවා. ඊට අමතරව ජාත්‍යන්තර ගැටුමකුත් තිබෙනවා. මේවා අරමුණු දෙකක්.

පාස්කු ඉරිදා ප්‍රහාරයේ අරමුණ ජාත්‍යන්තර දෘෂ්ඨිවාදී, අන්තවාදී, මූලධර්මවාදී කොටස් වලින් සමන්විතව ඇෆ්ගනිස්ථානය, ඉරානය ආක්‍රමණය. බටහිර ආසියාව උතුරු ආසියාව වැනි කලාපවල සාපේක්‍ෂ දේශපාලනය තිබුණු රටවල්. එයින් අදහස් වෙන් නෑ හොඳින් දේශපාලනය තිබුණා කියලා. නමුත් සාපේක්‍ෂව එහි සමාජ ආර්ථික දේශපාලනය තිබුණා. මේ ස්ථාවරත්වය දරාගත නොහැකි ලෙස සුඩානය, ලිබියාව වැනි රටවල් විනාශ කොට තිබෙනවා. පුපුරන්න ආසන්න දෙයක් ලෙසයි අද මෙය තිබෙන්නේ. ඇමරිකානු එක්සත් ජනපදය හා ඔවුන්ගේ ආරක්‍ෂාව නේටෝ වැනි සංවිධාන පකිස්තානය, කාශ්මීරය ඉන්දියාව හරහා මෙය විහිදී ගොස් තිබෙනවා. ඉතින් ඒ කලාප විශාල වශයෙන් මුස්ලිම් සමාජගතයි. පහුගිය අවුරුදු 20 පුරාවම මේ කලාපය තුල විවිධ මූලධර්ම පදනම් කරගත් මුස්ලිම් ආගමික නිකායන් බිහිවුනා. පෙර කී ඇමරිකාව හා නේටෝ සංවිධානය හා එහි රහස් ඔත්තුසේවාවන් පිටුවහලක් වුනා. මේවා වැඩිදියුණු කරනු ලැබුවා. උදාහරණ හැටියට ඔසාමා බින්ලාඩන් බිහිකළේ ඇමරිකාව. සවුදි අරාබිය සමග හවුල්ව ඇමරිකාව මුස්ලිම්වාදී කල්ලි හැදුවා. ඒ තුලින් රාජ්‍ය ව්‍යුහය සම්පූර්ණයෙන් විනාශ කරනු ලැබුවා. ඉරානය, සුඩානය, ලිබියාව ආදී රටවල් අල්කයිඩා, ISIS වැනි සංවිධාන ඒ හරහා බිහිවුනා. ඔවුන් හිතනවා ඔවුන්ගේ මූලධර්මවාදය තුලින් මුළු ලොවම අල්ලාගන්න. මුළු ලොවම මුස්ලිම් රාජ්‍යයක් විය යුතු යැයි ඔවුන් කල්පනා කරනවා. ISIS කියන්නේ එවැනි සංවිධානයක්. එය ඇමරිකාවේ හා නේටෝ සංවිධානවල සෘජු මැදිහත්වීමක ප්‍රතිඵලයක්. මේ ආණ්ඩුව මෛත්‍රීපාල වික්‍රමසිංහ හවුල විදේශ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම කනපිට හැරවූවා. නොබැඳි පිළිවෙතක් තිබූ විදේශ ප්‍රතිපත්තිය බටහිර ලැදි, බටහිර ගැති ප්‍රතිපත්තියකට මාරු කළා. ඉතින් මේ රටේ තීන්දු තීරණ ගැනීම අභ්‍යන්තර කාරණයක් නොව විදේශ කාරණයක් බවට පත්වුනා. මේක ඉතාතම පැහැදිලි වන්නේ ඇමරිකානු තානාපතිවරිය කථා කළ පිළිවෙල අනුවයි. ඒ නිසා අද ලංකාවේ බටහිර දේශපාලන ව්‍යාපෘතියේ කෑල්ලක් බවට පත්වෙලා තියෙනවා.

ඒ නිසා මෙම ප්‍රහාර නැවැත්වීමට නම් මිලිටරි මැදිහත්වීමකට වඩා ලංකාවේ ප්‍රතිපත්තිමය වෙනස් කිරීමට සිදුව තිබෙනවා. විශේෂයෙන් විදෙස් ප්‍රතිපත්ති ආර්ථික ක්‍රියා දෙකම රටින් පිටත සිදුකරවීම නැවැත්විය යුතුයි. සැමුවෙල් ගාඩින් කියූ ශිෂ්ඨාචාරයේ ගැටුම නවතා ඇමරිකානු අතපෙවීම විශේෂයෙන් තානාපති කාර්යාලය ලංකාවට කෙරෙන බලපෑම නැවැත්විය

## වහාබ්වාදය බෙදුම්වාදයකි



ඉස්ලාම් මූලධර්මවාදී ත්‍රස්ථවාදය ලොව පුරාම පැතිරී ගිය ආකාරය අධ්‍යයනය කළාම ඉතා හොඳින් සාක්‍ෂි තිබෙනවා බටහිර රටවල ඔත්තු සේවා හා ඉස්ලාම් අන්තවාදී මූලධර්මවාදීන් හා සම්බන්ධව කොයිතරම් දුරට ඔවුනොවුන් අතර අවබෝධයකින් කටයුතු කරන බව. අධිරාජ්‍යවාදීන් තම විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීමේ ආයුධය ලෙස මාක්ස්වාදී අන්තවාදීන් ඔවුන්ගේ මේ න්‍යායපත්‍රයට පාවිචචි කළද, ලොව පුරා වපුරන්නට බැරිවීම මත ආගමික මූලධර්මවාදීන් ඔවුන් විසින් නිර්මාණය කළා.

ඇමරිකාව තම ප්‍රතිවිරුද්ධ රටවල් මර්ධනය කිරීමට, මේ අන්තවාදීන් පාවිච්චි කළා. සීතල යුද්ධය කාලයේ අන්වර් සදාත් මරන්න එවැනි අන්තවාදී සංවිධාන බිහිකළා. ඊළඟට සුල්ෆිකාර් අලිබූටෝ, වැනි අය ඝාතනය කරන්නට ජමාත් ඉස්ලාම් වැනි සංවිධාන බිහිකළා. පෙර කී නායකයින්ගේ ඝාතන සිදුවන්නේ ඔවුන් වඩාත් රුසියාවට හිතවත් අයවලුන් වීම නිසයි. එක්දහස් හත්සිය හතලිස් ගණන්වල මොහොමඩ් ඉබාන් අල් වහබ් යන අය විසින් ඉන්දියාවේදී මේ වහාබ් වාදය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ උදව්වෙන් ලොවට හඳුන්වාදෙනවා. හින්දුන්ට එරෙහිව ඉන්දියාව බෙදා වෙන් කිරීමට තමා මුලින්ම වහාබ් වාදය පාවිච්චි කළේ. පසුව බ්‍රිතාන්‍යයන් විසින් සවුදි අරාබියේ ආගම බවට වහාබ්වාදය

# තාවගේ ස්වාධීනත්වයට තර්ජනයක්




පත්කරනු ලබනවා. සවුදි අරාබිය විසින් මුළු මුස්ලිම් ප්‍රජාව තුළම වහාබි වාදය ප්‍රචලිත කරන්නට ආධාර අනුබල දෙනු ලැබුවා. තලෙයිබාන් හා අල් කයිඩා ලෙසත්, ඔවුන් නැවත ISIS ලෙසත් විවිධ නම්වලින් විවිධ රටවලට ප්‍රවිෂ්ඨ වන්නේ මේ කියන වහාබිවාදයයි. ඒ අනුව පැහැදිලියි බටහිර අධිරාජ්‍යවාදය උපාංගයක් ලෙස පාවිච්චි කළ බව. ආණ්ඩු පෙරලන්නට මොවුන් මැදිහත් වුනා. ඒ වගේම ඇමරිකාව තුලත් මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළා. 9/11 න් පසු ඔවුන්ගේ සියළුම පුරවැසියන්ගේ දුරකථන සංවාද ගමන් බිමන් CCTV හරහා දත්ත ලබාගනු ලැබුවා. ඒ තුලින් තම ජනතාවගේ පෞද්ගලිකත්වය නැතිකරනු ලැබුවා. ඒ වගේම ලංකාවේ ආර්ථිකය වට්ටන්නත් මොවුන් පලිහක් ලෙස මුස්ලිම් අන්තවාදය තෝරාගත්තා. සවුදි අරාබියේ මුදල් වියදම් කරමින් සංවිධාන ගොඩනැගුවා. දැං මේ ගැටුම නිර්මාණය කිරීම හරහා ඇමරිකාව රට තුළට ගෙනඒමටත්, නේටෝ සංවිධානය ගෙනඒමටත් මේ රජය උත්සාහ ගන්නවා. දැන් ජනතා විමුක්ති පෙරමුණ පොස්ටරයක් ගහගෙන යනවා අන්තර්කාලීන ආණ්ඩුවක් ඕන කියලා. මේක ඇමරිකානු න්‍යායපත්‍රයේ එකක්. අන්තර් කාලීන ආණ්ඩුවක් කියන්නේ ඉදිරියට කිසිම ඡන්දයක් නැති වසර ගණනාවක් පස්සට දමන ආණ්ඩුවක් පිළිබඳවයි. ලිබියාවෙත් මෙහෙම කළා. මර්ධනකාරී ආණ්ඩුවක් හදලා මැතිවරණ නැති කළා. ඊජිප්තු පකිස්තාන් 2,000 කට වැඩි වහාබිවාදය උගන්වන්න පිරිස් ලංකාවට එන්න වීසා දීලා තියෙනවා. ඒ හින්දා මේ උඩ මර්ධනය නොකොට මේක විසඳන්න බැහැ. මරාගෙන මැරෙන ෆැක්ටරියේ තවම 09 දෙනයි අපි දැක්කේ. හමුදාව අත්අඩංගුවට ගත්තත් පොලීසියට භාරදෙනවා. පොලීසිය සමහර අය නිදහස් කරනවා. උසාවි දාල ඇප දෙනවා. හේනක ගොවියෙක්ගෙ ගල්කටස් එකක් හමුවුනත් ගිණිඅවි පණත තමයි දෙන්නේ. ඒ පනතම ත්‍රස්ථවාදියාටත් දෙනවා. ත්‍රස්ථවාදය වැළැක්වීමේ පනත උන්ට අදාළ කරන්නේ නෑ. අන්තවාදීන් හා මධ්‍යස්ථ මතධාරීන් වෙන්කරගත යුතුයි. රට රැක ගැනීමට කවුරුත් එකතු විය යුතුයි.


**ආචාර්ය චරිත හේරත්**

ඉරිදා පාස්කු දින සිද්ධිය මිලිටරි සිද්ධියක් වුනත් ඒකෙ දේශපාලනයක් තියෙනවා. කාලයකදී පන්ති දේශපාලනය හරහා මිලිටරි ක්‍රමවේදයක් හැදුනත්, ඊට පස්සේ වාර්ගික ප්‍රශ්න මුල්කරගත් ත්‍රස්ථ ක්‍රියාවලියක් මේ රටේ ඇතිවෙනවා අපි දුටුවා. නමුත් ඉරිදා පාස්කු සිද්ධිය තුළ ජාත්‍යන්තර ත්‍රස්ථවාදයක් හරහා දේශපාලන උවමනාවක් තියෙනවා. ඒ දේශපාලනය මේ රට තුළත් නිර්මාණය කරමින් තිබෙනවා. රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ඇතුළු මේ රජය ඒ අවකාශය හදලා තියෙනවා. ඒ හින්දා මට මේ සිද්ධිය හරහා විසඳුමක් හැටියට කියන්න තියෙන්නේ මේ ආණ්ඩුව ගෙදර යන්න ඕන. නැත්නම් යැවිය යුතුය. මොකද මේ සිද්ධිය ජාත්‍යන්තර ගැටගැසීම් තුළ 2015 යහපාලන ආණ්ඩුව වගකියන්න වෙනවා. මුස්ලිම් සමාජීය දේශපානය අපේ රටේ සංස්කෘතියට වගේම සිංහල බෞද්ධ සමාජයටත් අද වන විට ක්‍රිස්තියානි සමජයටත් යම් ආකාරයකින් ගැටළු හැටියට නිර්මාණය වෙන්න අවකාශය ලබා දුන්නා. ඒ මේ යහපාලන ආණ්ඩු විසින්. මේ රටේ ප්‍රධාන මුස්ලිම් දේශපාලන දහරාවම ක්‍රියාත්මක වුනේ අරාබිකරයේ න්‍යායපත්‍රයට. ඒකෙන් පෙනී යනවා ඔවුන් කොයිතරම් දුරට තම මතවාදය ක්‍රියාත්මක කරාදැයි කියලා. අනික 2015 මේ යහපාලන ආණ්ඩුව ආවේ අලංකාර දේශපාලනයකින්. ආකාර්ශණය වන වචන වලින්. නමුත් ඒ අලංකාරවල කිසිදු පදනමක් තිබ්බේ නෑ. වචන පමණයි. ඒකයි මම කියන්නේ ඒක අලංකාර දේශපාලනයක් කියලා. ඒ අවස්ථාවෙන් නිසි ප්‍රයෝජනය ගත්තේ බටහිර රටවල් සහ මුස්ලිම් දේශපාලකයො ඇතුළු වාර්ගික

## ත්‍රස්ත ප්‍රහාරය මුස්ලිම් සමාජයේ ආගමික උම්මත්තකයින්ගේ ක්‍රියාවක්



පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ මේ වන විට සමාජය තුළ බරපතල ලෙස සැකය අවිශ්වාසය යන කාරණා මතුවෙලා තියෙනවා. ජාතීන් අතර මෙය බේදනීය තත්වයක්. දශකයකට පමණ ආසන්නව ශ්‍රී ලාංකීය සමාජය ආපස්සට ගිහිං තියෙනවා. යුද්ධය පැවති සමය වගේ ජීවිතයේ අනියත බවක් නැවත දැනිලා තියෙනවා. අනාරක්ෂිතව බවක් ගොඩනැගිලා තියෙනවා. මේ තැතිගැනීම තුළ ඉඳන් තමයි අපට ජීවත් වෙන්න වෙලා තියෙන්නේ. අනික් පැත්තේ විවිධ පිරිස් ආගම්වාදය, ජාතිවාදය පතුරමින් තිබෙන මොහොතක සියළු තත්වයන් සැළකිල්ලට ගත්තාම බියෙන් ජීවත් වීම තමයි සියලු දෙනාටම සිදුවෙලා තියෙන්නේ.

පසුගිය කාල වකවානුවේ ශ්‍රී ලකාව ගැන ජාත්‍යන්තරව යහපත් ප්‍රතිරූප ගොඩනැගිල තිබුණා. දැන් මේ තත්වය බිඳවැටිල තියෙනවා. සංචාරක ආකර්ශණය නැතිවෙලා තියෙනවා. රාජ්‍යය පිළිබඳ තිබුණු යම් විශ්වාසනීයත්වයක් තිබුණා නම් එය බිඳවැටිලා තියෙනවා. සුරක්ෂිතභාවය, සහජීවනය වැනි කරුණු හරහා තිබුණු ධනාත්මක ප්‍රතිරූපය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තියෙනවා. මේක අතිශය සෘණාත්මක තත්වයක තමයි මේ වන විට දකින්නට ලැබෙන්නේ.

ඒ වගේම පාස්කු ප්‍රහාරයේ ප්‍රහාරකයන් ආවේ කවුරුත් දන්න විදිහට මුස්ලිම් ජන සමාජය තුලින්. එතකොට මුස්ලිම් ජන සමාජයේ ඉන්න පිරිසක් ආගමික උමතුවකින් කරපු ක්‍රියාවක් ලෙස තමයි මේක දකින්නට ලැබෙන්නේ. ඇත්ත වශයෙන්ම මුස්ලිම් සමාජයේ තියෙන පසුගාමී ලක්ෂණ මේ සඳහා හේතු වෙලා තියෙනවා. අපි මේ ප්‍රශ්ණ දකින්න වෙන්නෙ මීට වඩා පුළුල්ව. ඒක තමයි ලංකාවේ මේ වන විට ලක්ෂ 20 කට ආසන්න මුස්ලිම් ජාතිකයන් ඉන්නවා. ඔවුන් 200 කට වන් පිරිසක් තමයි මේ ත්‍රස්ථ ක්‍රියාවලියේ යෙදෙන්නේ. අපි එයින් බලන කල මෙය කොතරම් කුඩා ප්‍රතිශතයක් දැයි හිතෙනවා. එතකොට සමස්ථ මුස්ලිම් සමාජයම මෙයට වගකිව යුතු නැහැ. හැබැයි සමස්ථ මුස්ලිම් සමාජයම චූදිතයින් හැටියට හිතන තත්වය තමයි මේ වෙලාවේ තියෙන්නේ. මුස්ලිම් ජන සමාජය පීඩාවට පත්වෙලා තියෙනවා ඒ පැත්තෙන්. ඒත් අපි ඇත්තටම මෙය ගැඹුරින් සාකච්ඡා කළාම තවුෆික් ජමාද් කියන සංවිධානය මේ සිද්ධියේ බළල් අත් වන්න පුළුවන්. ජාත්‍යන්තර සංවිධානයක් මෙය මෙහෙයවනවා, ISIS වගේ. ඔවුන් මෙහි වගකීම භාරගෙන තිබෙනවා. ISIS කියන්නේ පැහැදිලිවම ඇමරිකාවේ නිර්මිතයක්. අප්‍රිකාව සිරියාව වැනි රටවලට අතපොවන්න බළල් අතක් ලෙස පාවිච්චි කළා. ඉතින් මම හිතන්නේ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට ලොකු බලපෑමක් කළා කියලා මේ ප්‍රහාරය හරහා. මේ ජගත් අදිසි හස්ථය හඳුනාගැනීමේන් තොරව අල්ලපුගෙදර මුස්ලිම් මනුස්සයට ආයුධ ඔසවලා වැඩක් නැහැ කියලා හිතන්නේ. මා පොදු ශ්‍රී ලාංකික සමාජයෙන් ඉල්ලන ඉල්ලීම සැක හැර සමස්ථ ශ්‍රී ලාංකික සමාජයේම පොදු හතුරා කවරෙක් දැයි තේරුම්ගන්න කියා. එතකොට තමයි මේ ගැටළුවට විසඳුම සොයාගත හැක්කේ.

# පළාත් පාලන පනත ගැන අගමැති පොල් ගානවාද? හාල් ගරනවාද?

කණ්ඩායම් විතරයි. ඒකට යහපාලනයට එකතු වුණු සියළුදෙනා වගකිව යුතුයි. ඔවුන්ට තිබුණු එකම බලාපොරොත්තුව රාජපක්ෂවරුන් සහ අනුගාමිකයින් විනාශ කිරීම. අඩුතරමේ විනාශ කරන ක්‍රමෝපායක් ඒ තුළ අන්තර්ගත වුනේ නෑ. ඔවුන් අත්අඩංගුවට ගත්තා, ප්‍රශ්ණ කළා, ත්‍රිවිධ හමුදාවේ අය අත්අඩංගුවට ගත්තා, බුද්ධි අංශය දියාරු කර හැරියා. මහා වරදක් කළ හැටියට ඒ අය චෝදනාවට ලක් කළා. මෙම මරාගෙන මැරෙන ප්‍රහාරයට සතියකට කලින් පැය 08 ක් හිටපු නාවික හමුදාපති ප්‍රශ්න කිරීමට ගත්තා. මේ අය කළේ රට දියාරු කිරීම විතරයි. ඒ වගේම යහපාලන ආණ්ඩුව විසින් ආඩපාළු දේශපාලනයක් කියලා රටේ මූල්‍ය විනය විනාශ කළා. මහ බැංකු මංකොල්ලයට ප්‍රධාන සාධකය. ඒවගේම ඔවුන් කථා කළ ප්‍රජාතන්ත්‍රවාදයත් අද නැහැ. මැතිවරණ සිතියම අකුලලා. ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් අයිතිවාසිකම් උල්ලංඝනය කළා. අගමැතිතුමා අහනවා ප්‍රතිත්‍රස්ථ පනත ගේන්නේ නැතිව පොල්ගානවාද කියා. නමුත් සංශෝධිත පළාත් සභා පනත අවුරුද්දකටත් වඩා කාලයක් එතුමා ගාවයි තවම තියෙන්නේ. ඒකට පොල්ගානවාද නැත්තන් හාල් ගරනවාද කියලා මම දන්නේ නෑ. මේ කාරණා හරහා අද ජාත්‍යන්තර ත්‍රස්ථවාදයට පිටිය ලංකාව නිර්මාණය කොට හමාරයි. ඒකට මේ යහපාලන ආණ්ඩුව වගකිව යුතුයි.

**සාකච්ඡාව - ජනබන්දු සේනානායක**



# ත්‍රස්තවාදී මත් රකුසා රටම ගිලගනී...

## දස මාර කුඩු සේනා

මත් ද්‍රව්‍ය මෙරට සියළු මාධ්‍යන්හි දිනපතා ප්‍රවෘතියක් බවටත්, මත් උවදුර මැඩීම රජයේ දෛනික කාර්යභාරයක් බවටත් පත්වෙලා.
1980 දශකයේ පමණ සිට හෙරොයින් නැමැති මාරයා කොළඹ කේන්ද්‍ර කරගනිමින් අපේ තරුණයන් එකා දෙන්නා සිය වසගයට ගත් අතර අදවන විට ගම් නියම්ගම් ආක්‍රමණය කරමින් දසමාර සේනාවක් ලෙස ව්‍යාප්ත වෙලා.
හෙරොයින්, කොකේන්, හෑෂ්, අයිස්, හසීස්, මොෆීන්, කේරල ගංජා, මත් එන්නත්, රසායිනික දුම්වැටි, මත්පෙති, නමින් හදුන්වන මරුවන් රැසක්ම බෝ වෙලා.
මෙකී මත්ද්‍රව්‍ය 2018 පෙබරවාරි පමනක් කොතරම් ප්‍රබලව දිවයින පුරා ව්‍යාප්ත වී ඇත්දැයි පෙබරවාරි මස තුල අත්අඩංගුවට ගත් විශාල කුඩු ප්‍රමාණ දෙස බැලීමේදී පෙනී යයි.
පෙබරවාරි 06දා හෙරොයින් කිලෝවක් බියගමදීද, පෙබරවාරි 15දා කෝටියක කේරල ගංජා මරදානේදීද, පෙබරවාරි 23 දා ලක්ෂ 60ක හෙරොයින් කැළණියේදීද,පෙබරවාරි 23 දා කොටි 10 හෑෂ් නැමති මත්ද්‍රව්‍ය කිලෝ 8ක් කොච්චිකඩේදීද, පෙබරවාරි 23 දා රුපියල් දශලක්ෂ 2945 කට වැඩි වටිනා හෙරෙයින් කිලෝ 249කුත් ග්‍රෑම් 490ක් මොරටුවේදීද, පෙබරවාරි 25 දා කොටි 15වක හෙරොයින් කිලෝ 15ක් හා කිලෝ 10ක් අයිස් නැමති මතද්‍රව්‍ය කුලියාපිටියෙන්ද, පෙබරවාරි 30 දා වටිනාකම කෝටියකට අධික හෙරොයින් කිලෝ 3ක් කැළණියේදීද අල්ලා ඇත.
මාර්තු 11 දා හෙරොයින කිලෝ 167ක් සමග මුදුෂ්ගේ ගෝලයෙකු වූ කැලුම් ඉන්දික නැමැත්තා අත්අඩංගුවට ගත් අවස්ථාවේ මග දෙපස රැස්ව සිටි ජනතාව ප්‍රීතිඝෝෂා පවත්වමින් විශේෂ කාර්යසාධක බලකායට සිය ප්‍රණාමය පුදන අයුරු රූපවාහිනියෙන් දැකගන්නට ලැබුණි

## කුඩු ජාවාරම්කරුවන් පිටුවහල් කළ යුතුයි.

අගරදගුරු මැල්කම් රංජිත් පියතුමා කතෝලික සභාවට නිවේදනයක් නිකුත්කරමින් දන්වා ඇත්තේ මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් කතෝලික සභාවෙන් වහාම නෙරපා හරින ලෙයසි. තවත් වරෙක උන්වහන්සේ ප්‍රකාශකර තිබුණා කුඩු ජාවාරම්කරුවන් රටින් පිට දූපතකට පිටුවහල් කරන්ක කියලා.

ආසියාවට මත්ද්‍රව්‍ය බෙදාහරින රට ශ්‍රී ලංකාව බවට ඉන්දියාව, මැලේසියාව ආදී රටවල් මෙරටට චොදනා කලේ ලංකා ආණ්ඩුවෙන් ඊට සහයක් නොලැබෙන බවය, මෙරට සමහර දේශපාලඥයිනගේ ලැප්ජා නහර කපාගෙන සිටීමත් ඊට හේතුවී ඇතී

චීන විප්ලවයට පෙර මාඕසේතුං මතට ඇබ්බැහි වූවත් ඉන් මුදාගැනීමට කසපහර දී බරපතල වැඩවල යෙදවීය.
පිලිපිනයේ, මැලේසියවේ, ඉන්දියාවේ හා ඇමරිකාවේ මර්ද්‍රව්‍ය වැරදි වලට දඩුවම් මරණයයි.සෞදි අරාබිය ප්‍රමුඛ මැදපෙරදිග රටවල මත් වැරදිකරුවන්ට කුරිරු දඩුවම්ද පමුණුවයි. මත්ද්‍රව්‍ය මර්ධනය - හිරගෙවල් අරඹයි

## ආසියාවේ අභිමානය ලතීෆ්ට

මත්ද්‍රව්‍ය මැඩලිමට ක්‍රියාකල නියොජ්‍ය පොලිස්පති, ආර්. එම්. ලතීෆ් මහතාට ඉන්දියාව ආසියාවේ ''අභිමානය'' නම්වු අබ්දුල් කලාම් ගෞරව සම්මානය පසුගියදා පිරිනැමීමෙන්, ලංකාව මත්ද්‍රව්‍ය විරොධී වැඩපිලිවෙල ජාත්‍යන්තර පිලිගැනීමටද ලක්වී ඇත

මත්ද්‍රව්‍ය වලින් විනාශවී ඇත්තේ මත්ලෝලින්ගේ ජීවිත පමනක් නොවේ. ඔවුන්ගේ දුදරුවන් ඇතලු පවුල් සංස්ථාවම විනශ මුඛයට ඇදදාමා ඇත. මත් උමතුවෙන් සියදිවි නසාගත් තරුණයින්ගේ සංඛ්‍යාවද අපමනය.සිහිවිකල්ව අයාලේයන තරුණයන්ද අපමනය. රටතුල සිදුවන මංකොල්ලා කෑම්, ස්ත්‍රී දුෂණ ආදී අපරාධ සමහරකටද මත්ද්‍රව්‍ය හේතුවී තිබේ

ගාල්ලේ හිරගෙදර ඉන්න අයගෙන් සියයට 65ක් මත්ද්‍රව්‍ය වලට වැරදිකරුවන්වූ අය බවට දකුණු පලාත් ආණ්ඩුකාර තුමා ප්‍රකාශකර තිබේ. වැලිකඩ හිරගෙදර සියයට 70ක්ද, යාපනය, වවුනියාව, මඩකලපුව හැර අනෙකුත් සියලු හිරගෙවල්වල තත්වයද මේහා සමානයී

බන්ධනාගාර වාර්ථාවකට අනුව රැදවියන්ගෙන් සියයට 43ක් මත්ද්‍රව්‍ය වැරදිකරුවන්ය. සියයට 90ක් අවුරුදු 18 - 30 අතරවේ.

## භාණ්ඩාගාරයේ තොරතුරු ජනතාව බියගන්වයි

බිලියන 94ක් බව ගවේෂණ වාර්ථාවලසදහන්ව තිබේ. මත්ද්‍රව්‍ය වලින් රෝගීවන්නන් සඳහා රජයේ මුදල් වියදම් වලින් සියයට 22ක් වියදම් වන බවත් වාර්ථාවී ඇත.2018 මැදභාගයේ සිට දෙසැම්බර් දක්වා අත්අඩංගුවට ගෙන ඇති ප්‍රමාණය කිලෝ 732කි. සැකකරුවන් සංඛ්‍යාව 40.938 කි. 2019 ජනවාරි 25 සිට පෙබරවාරි දක්වා අත්අඩංගුවට ගත් හෙරෙයින් ප්‍රමානය කිලෝ 814කි. දෙමසකදී අත්අඩංගුවටගත් සැකකරුවන් සංඛ්‍යාව 6.653 කි.
මත්රකුසා බිලිලෙන ඇති බහුතර ජනකොටස දිලිදු පවුල්වල තරුණයින්ය. ඊට සාපේක්සව මැදපංතික උගත් තරුන පිරිසක්ද සිටී. රටපුරා පවත්වාගනයන පුනරුත්තාපන කදවුරු වලට යන්නෙකුට මේ තත්වය මැනවින් දැකබලාගත හැකිය.මෙ පවතින සමාජ, ආර්ථික, දේශපාලනයේ ප්‍රතිපලයක් බවත් අවබෝද වනවා ඇත.
එසේම ඔවුනගේ ජීවිත කතා අසන කවරෙකුට වුවද දැනෙන සංවේගය අපිරිමිතය.මත්ද්‍රව්‍යට අබ්බැහි වූවන් ඉන් මිදීමට තැත් කලත් ආත්මය ගිලගත් මත් රකුසාගෙන් ගැලවීමක් නැත. ආණ්ඩුව හා ජනසමාජය එවුන් මතින් මුදවාගැනීමට උරදිය යුතුව ඇත.
මත් ජාවාරම්කාර මදුෂ්ගේ එක බැංකු ගිණුමක රුපියල් කෝටි 1000ක් තිබීමෙන් මත් මාරයාගේ බලය කොතරම්දැයි කිවයුතු නැත

## මතට තිත හා කුඩු වසංගතය

2005 දී බලයට පැමිණි ආණ්ඩුවද රටට සහතිකවුයේ මතට තිත තබන බවටය. අවසානයේ කුඩු වසංගතය දිවයින පුරා විසිරගොස් සමහර දේශපාලකයින් මත් ජාවාරම්කරුවන්ගේ ගැලවුම්කරුවන් බවටත් බොහෝ වාර්ථා පලවිය.
කලයුත්තේ කුමක්දැයි කිව්වත්
මත් ජාවරම්කරුවන් මරනීය දන්ඩනයටත්, ජීවිතාන්තය දක්වා සිරදඩුවමටත් ලක්කොට සිරගෙවල්වල සිටියදිත් මත්ජාවාරම මෙහෙයවනවා නම් එය මැඩපැවැත්වීමට කලයුත්තේ කුමක්ද යන්න මානව හිමිකම් සංවිධාන ,ජිනීවා හාම්පුතුන් හා මෙරට ඊනියා ගැලවුම්කාරයින් රටට පෙන්වා දියයුතුය.එසේ නොකර ජානාධිපතිතුමා හා මත්විරොධී වැඩපිලිවෙල හුදු විවේචනයට ලක්කිරීම මෙරට ජනතාවට කරන ද්‍රෝහිකමකි.නීතිඥ ප්‍රජාව තම වෘත්තීයේ ගරුත්වය රැකගැනීමට ක්‍රියාකල යුතුය.උසාවිවල මත්ජාවාරම් කරුවන් වෙනුවෙන් පෙනීසිටීම අත්හැරිය යුතුව ඇත.(මත්ලෝලීන් නොවේ)
මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය මහතා මරාදැමූ පොට්ට නවුපර් වෙනුවෙන් පෙනීසිටීම නීතීඥවරුන් ප්‍රතික්ෂේප කලා සේම මෙරට ජනතාවගේ දූදරුවන් බිලිගන්නා කුඩු ව්‍යාපාරිකයන් වෙනුවෙන් පෙනී සිටිමින් සාක්කු පුරවා ගනිමින් සිටී.

## මත් විරෝධය ලකුණු දාගැනීමක්ද

පෙබරවාරි 17 දා ලංකා පුවත්පත සමග සම්මුඛ සාකච්ඡාවක යෙදෙමින් ජනාධිපතිගේ මත්විරොධී වැඩපිලිවෙල මානවහිමිකම්, විදේශ ආධාර, පී.ඒස්.පී. බදු සහන අහිමිකරමින් ලකුණු දාගන්න කරන දෙයක් බවට බරපතල විවේචනයක් කර තිබේ. මේ ''ශුද්ධෝත්තමයාගේ කෙරුවාව ගැන කිවහැකි බොහෝදේ ඇතී
එ.ජා.ප. පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන්ද ජනාධිපතිවරයාගේ මෙම ක්‍රියාමාර්ග නිතරම විවේචනය කරන්නෙකි.
මත්ද්‍රව්‍ය බෙදාහැරිම සම්බන්ධව කියවෙන කින්චිපානි ගේ සමීපතමයෙකු වූ මොහොමඩ් රිස්කාන් මුජිබර් රහුමාන්ගේ සමීපතම ආධාරකරුවෙකි. කුඩ ප්‍රවාහනය සඳහා යොදාගැනීමට රිස්කාන් මෙරට ආරම්භකල ''ඩ්‍රොප්මී'' ටැක්සි සේවාවේ වැලිසර ශාඛාව විවෘත කිරිමට 2018 පෙබරවාරි 8 දා අගමැතිවරයාද සහභාගිකරවා, විවෘත කිරිමට රහුමාන්ද සහභාගී වූයේය

## සමාජ විරෝධී නරුමයන්.

මත් උවදුර මැඩලීමට ජනපති ගෙන ඇති වැඩපිලිවෙලට එරෙහිවිය හැක්කේ දේශාද්‍රෝහී, සමාජ විරෝධී නරුමයන්ට පමණී

මෛත්‍රීගේ වැඩපිලිවෙල වී ඇත්තේ මහාපරිමාන මත්ජාවාරම්කරුවන් එල්ලා මැරීමත් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනුරුත්තාපනය කිරීමත්ය. මත් උවදුර මැඩලිමට ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවා සංයුක්ත ක්‍රියාමාර්ග වලට එලඹීම, දැනුවත් කිරීමට ක්‍රියාකිරීමත් සහ කුඩු සංහාරය උදෙසා ත්‍රිවිධ හමුදාවට බලයද පවරා තිබේ

ජනාධිපතිගේ ප්‍රායෝගික වැඩපිලිවෙලට ගරහන සුළුතර නරුමයෝ කිසිදු වැඩපිලිවෙලක් ඉදිරිපත් නොකොට නම් දොඩවති
.
මත්ජාවාරම්කරුවන්ට එල්ලුම්ගහ නොපෙන්වා පෙන්වන්නේ අහවල් එකද?
අවසන්වශයෙන් සඳහන් කරන්නේ මත්විරොධී සටනට දායකත්වය දුන් පොලිස් නිලධාරීන්ටත් රාජ්‍ය සේවාවන්ටත් මෙරට ජනතාවගේ ප්‍රනාමය පිරිනැමිය යුතු බවයී

**ටිකිරි දිසානායක**

## කවි සිතුවිලි

### අහෝ සුන්දර වද මල

පුදසුනට අකැප යැයි
එහි නොවඩවන
පෙර රජ දවස
මරණීය දණ්ඩනයට
කැප වූවන්ගේ
ගෙලෙහි පැලදවූ
මාලාවක්මවූ
රත් වද මල
එනමුදු
එහි මධුර පැණි පරාග
සමනල බිගු බටිති කැලට
දිව බොජුනක්ද වී
ඕනු සතුන්ට
කදිම ආහාරයක්ද වු
අනර්ඝ ඔසුවක්ද වු
රත් වද මල
මේ සියළු දුක සැප
සම සිතින් ඉවසා දරා
මද පවනේ සැනසෙන
සුන්දර රත් වද මල...

**හිගුල - මංගල විජේසිංහ.**

### රට බල්ලට ගියත් මොකද තොපිම ඉදන් රට කාපිය

කවුන්සලේ බත් තියෙනව අපිට ඒවා හරි ලාබය
ආප්පයක් රුපියල් පහලොවට අරන් තොපි කාපිය
පොහොර නැතිව වී කොයින්ද දැන් විකුනාගන කාපිය
සැප වාහන අපේ පිනට තොපි බස් ඇතුලෙම හිටපිය

මැරෙන්නෙ නෑ නොකෑවට තොපි එක වේලක් කාපිය
පැන්ෂන් එක අපට පමණී තොපි කටවහගෙන හිටපිය
මාදුළුවාවෙට කලදෙය දන්නවානෙ මේ අහපිය
ළග එනවා පොඩි ඡන්දය ඒකත් අපටම දීපිය

ඡන්දෙට ගොස් පැරදුනු අය ඉස්සරනම් ගියේ ගෙදර
දැන් කාලේ එහෙමම නෑ ඇමති කමක් ලැබේ මිතුර
ඡන්දය බල්ලට ගිහිල්ලා වටිනාකම නැතිව කතිර
ඡන්දය දී අපි මෙකටද ඔන්න ඔහේ ඉදිමු ගෙදර

**කිරිඇල්ලේ - සුමනවීර**

# ත්‍රස්තවාදය, ජාතිවාදය, අවස්ථාවාදී දේශපාලනය හා කම්කරු මර්ධනය පිටු දකිමු .



පසුගිය දිනවල සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරය ගැන ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ ලේකම් පා.ම. වාසුදේව නානායක්කාර සහෝදරයා නිවේදනයකින් ජනමාධ්‍ය වෙත කරුණු දක්වා තිබේ.

අන්තවාදී පිරිසකගේ ත්‍රස්ත ක්‍රියාව සිදුවී ඇත්තේ වසර ගණනාවක සිට මනස සකස් කිරීමකිනි. එල්.ටී.ටී. බෙදුම්වාදී යුද්දය අවසන් කලද නැගෙනහිර පලාත කේන්ද්‍රගතව නිර්මාණය වෙමින් තිබූ අන්තවාදී ත්‍රස්ත කණ්ඩායම් මැඩ පැවැත්වීමට මෙම ආණ්ඩුව කිසිදු උත්සහයක් දරා නොමැත. වසර 30ක බෙදුම්වාදී යුද්ධය වසර 03ක් වැනි ඉතාමත් කෙටි කාලයකාන් අවසන් කිරීමට මහින්ද රාජපක්ෂ මැතිතුමා නායකත්වය ගත් පසුගිය රජයට හැකි විය. වර්තමාන රජය නිසි මගපෙන්වීමක් ලබා නොදීම හා මුස්ලිම් අන්තවාදයට බුරුලක්දී එය වැඩෙන්නට ඉඩහැරීම මෙම විනාශයට හේතුවක් වී තිබේ.

වත්මන් රජයට පසුගිය වසර 04 පුරා මෙම අන්තවාදීන්ට ඔක්සිජන් සපයා ඇති බව අගමැති, ජනපති ප්‍රකාශ වලින් තහවුරුවේ. මෙම කණ්ඩායමේ ISIS පුහුණුව ලබා පැමිණි බව රජය දැන සිටියත් ඔවුන් මැඩ පැවැත්වීමට රටේ නීතිය ප්‍රමාණවත් නොවන බව දැන් අගමැතිවරයා ප්‍රකාශ කිරීම විහිළුවකි. රජය තම වගකීම අමු අමුවේ උලංගනය කර ඇත. ආරක්ෂක ලේකම්වරයා හා පොලිස්පතිවරයා ඉවත් කිරීමෙන් රජයට ගැලවීමේ හැකියාවක් නොමැත.ආණ්ඩුවේ අභ්‍යන්තර දුර්වල තාවයේ ප්‍රතිපලයක් ලෙස අද රටම අනාරක්ෂිතය. රටට වටිනා ජීවිත ගණනාවක් අහිමි වීමත් විදේශිය සංචාරකයින් මිය යාමත් නිසා සෙද්ශීය වශයෙන් පමණක් නෙව ජාත්‍යන්තරවද අප රටට මැකිය නොහැකි කැලලක් සිදුවී ඇත. දීර්ගකාලීනව බලයේ සිටීම අරමුණු කරගෙන අවස්ථාවාදී අදුරදර්ශී පාලනයට උපමාරුවලට ඉඩක් නොතැබිය යුතුය. පොදුජන විරෝධතා උද්ඝෝෂණ මර්ධනයට ආණ්ඩුව ගෙන එන ත්‍රස්තවාදය වැලැක්වීමේ නව පනත පරාජය කළ යුතුය.

ශ්‍රී ලංකා ආණ්ඩුකම ව්‍යවස්ථාවෙන් ජනතා පරමාධිපත්‍ය ලෙස පැවරී ඇති ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද අයිතිය කොල්ලකමින් කලට වේලාවට මැතිවරණ නොපවත්වා අත්තනෝමතිකව, අයුක්තිසහගතව ගෙනයන පාලනයේ අනිවාර්ය ප්‍රථිඵලයක් ලෙස ත්‍රස්තවාදය පැනනැගී ජනතාව විපතට පත්ව තිබේ. ආණ්ඩුවේ නොහැකියාව ලොවටම පෙන්නුම් කර හමාරය. සෑම පුරවැසියෙකුටම ආරක්ෂාව ලබාදීම ආණ්ඩුවේ වගකීමකිසත් වුවත් එයින් බැහැරවී අගමැතිවරයා විදේශ හමුදා ගෙන්වා ජනතාවගේ ස්වාධීනත්වය, ජාතික නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කිරීමට බලයි. එබැවින් වහාම ආණ්ඩුව ඉල්ලා අස්වී තාවකාලික ආණ්ඩුවට බලය පැවරන ලෙසද, අන්තර් ආගමික සභාවක් නීත්‍යානුකූලව පිහිටුවා සංහිඳියාවට ඉඩසලසන ලෙසද, වහාම මැතිවරණ පවත්වා ප්‍රජාතන්ත්‍රවාදය හා ජන ජීවිතය ස්ථාපිත කරන ලෙසද ජනාධිපතිවරයා ක්‍රියාත්මක විය යුතු බව තවදුරටත් එම නිවේදනයේ දැක්වේ.

## මර්ධනය නොතකා වැඩකරන ජනතාව ප්‍රහාරයකට සැරසෙයි

ජීවන වියදම ඉහල යාම නිසා මතුවන ජනතාවගේ උද්ඝෝෂනයන් සැහැසි ලෙස මර්ධනය කිරීමට විරෝධය දක්වමින් ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ නිකුත් කළ නිවේදනයේ මෙසේ දැක්වේ.

වර්තමාන ආණ්ඩුව ජනතාවට දරාගත නොහැකි ලෙස අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඉහල දමා , බදු පිට බදු බර පටවා තිබේ. ජීවන බරින් මිරිකී. ජීවත්වීම සදහා අසීරු සටනක නිරතවී සිටින ජනතාවතව දුරටත් තලා පෙලා හිරිහැර කිරීම සඳහා මෑතක සිට ඉන්දන, කිරිපිටි මිල සූත්‍රය නැවත ක්‍රියාත්මක කරයි.

ආණ්ඩුවේ ක්‍රියාපිලිවෙත නිසා වී වගාකල ගොවියෝ අස්වනු නිසි මිලකට අලවි කරගත නොහැකිව විරෝධතාවන්ට ඇදෙමින් සිටී. එලවලු වගාකරුවන්ද තම අස්වනු අලෙවි කරගත නොහැකිව අස්වනු ගොඩගසා මහ මඟ ලතවෙයි.

නිදහස් අධයාපන කප්පාදුව නිසා සිසු අරගල දිනෙන් දින වර්ධනය වෙමින් පාරට ඇදෙමින් පවතී. ගුරුවරු-විදුහල්පතිවරුද උද්ඝෝෂණ කරති. රාජ්‍ය යාන්ත්‍රණය අඩපන කිරීමට විරුද්ධව කළමනාකරණ සහකාර නිලධාරීන්ද, පරිපාලන සේවයේ නොවන අනිකුත් මාණ්ඩලික නිලධාරීන්ද, සේවා නිහඩතාවය බිදිමින් ක්‍රමක්ක්‍රමයෙන් වෘත්තීය ක්‍රියාමාර්ග ඔස්සේ අරගල බිමට ඇදෙමින් තිබේ.

සමස්තයක් ලෙස සඟ, වෙද. ගුරු, ගොවි, කම්කරු, රණවිරු හා අන්‍ය ජනවර්ගයන්ද එක්වූ සප්ත මහා බලවේගයක් ආණ්ඩුවට විරුද්ධව අරගල මාවතකට පෙලගැසෙමින් විරෝධතා, උත්ඝෝෂණය රටපුරා පැවැත්වීම ආරම්භ වෙමින් තිබේ. වර්තමාන දුර්දාන්ත අවිචාරවත් ආණ්ඩුවේ සමාජ. ආර්ථික, දේශපාලන ප්‍රතිපත්ති නිර්දය ලෙස ක්‍රියාත්මකවීම නිසා පොදු ජනතාවගේ ජීවත්වීමේ අයිතිය විනාශ මෙන් තිබේ. ඒ අතර ධනය හිමි ඉතා සුළු පිරිසකට ධනය රැස්වෙන බදු සහන සහිත සුඛවිවරණයත්, හිමි කරදී ගෙන තිබේ. එම අසාධාරන පිලිවෙත වෙනස් කිරීමට ජනතාවට ඉඩදීම සඳහා වහාම මැතිවරණ පවත්වන ලෙස රජයට බලකර සිටිමු යනුවෙන් එම නිවේදනයේ දැක්වේ.

**බුලත් විටක් රු : 30/-**
**වී කිලෝවක් රු : 25/-**
**යහපාලන රඟ**

## ශක්තියයට ආධාර කරන්න

**මුල්‍ය දුෂ්කරතා අභිබවමින් මාස්පතා ශක්තිය ඔබ වෙත එවිමට අපි වෙහෙසෙමුග ශක්තිය පුවත්පත පවත්වාගෙන යෑම වෙනුවෙන් ඔබ ලබාදෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අප වෙත ලබාදෙන්න. ඔබගේ මුදල වෙනුවෙන් රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. සියලු මුදල් පහත දක්වන අකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුදුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකිවන පරිදිඑවන්න.**

**එම්.බී.සරත්පත්මදාස - ශක්තියකළමනාකරු**

## අපගේ ශෝකය

**තිරශ්චීන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරය නිසා අතපය අහිමි කර ගනිමින් සදාකල් අසරණභාවයට පත්වූ හා බරපතල තුවාල සිදුවූ සියලු දෙනා වෙනුවෙනු ඉක්මන් සුවය පතමු. එසේම අප අතරින් වෙන්ව ගිය අහිංසක සමකාමී ආගමික ජනතාවත්, නිදහසේ සිත්සේ සතුටින් ගත කිරීමට ලක් දිවට පැමිණ විදේශක රටවල පුරවැසියන් වෙනුවෙනුත්, විශේෂයෙන්ම නව ලොවක අරුනලු දැකීමට පාස්කූ දිනයේදී උද්දාමයෙන් සිටි දූදරුවන්ගේ සියලු දෙනාගේ වියෝව කිසිදිනක අමතක නොවන බේදවාචකි.ඔබ සැම වෙනුවෙන් ශක්තියේ අප සැම බලවත් ශෝකය ප්‍රකාශ කරමු.**




## ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් නොසැලෙමු. බිය සැක දුරු කර ජනතාව ඒකරාශී කරමු.

**-හිටපු නියෝජ්‍ය අමාත්‍ය නාවලගේ බෙනට් කුරේ.**

-

කොටිකාවත්ත- මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ නවක මන්ත්‍රිවරුන් මුණගැසීමේ සුහද හමුවක් ප්‍ර.වා.පෙ. මන්ත්‍රිනි සමන්පානී මනම්පේරි මැතිතුමියගේ ආරාධනයෙන් මුල්ලේරියාව සමගි මාවතේදී පැවැත්විය.

එම සුහද හමුවේ මුලසුන ප්‍රාදේශීය සභාවේ සභාපති රංගජීව මැතිතුමා හෙබවූ අතර ප්‍රධාන දේශනය පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව සහෝදරයා ඉදිරි පත් කල අතර ආරාධිත කථිකයින් ලෙස සහ හිටපු නියෝජ අමාත්‍ය නාවලගේ බැනට් කුරේ මැතිතුමා සහ ජාතික නිදහස් පෙරමුණ හේමසිරි මැතිතුමා සහභාගී විය.

මෙහිදී කරුණු දක්වමින් නාවලගේ බැනට් කුරේ මැතිතුමා ප්‍රකාශ කලේ 30 අවුරුදු බෙදුම්වාදී ත්‍රස්තවාදය වසර 3කින් පරාජය කිරීමට අපගේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයට හැකි වූයේ ජනතාව බිය නොවුන නිසාය. හදිසියේ මතුවූ ස්ලාමීය ත්‍රස්තවාදයට කිසිසේත් අප බිය නොවිය යුතුයි. විශේෂයෙන් කොලොන්නාව ආසනයේ 30% පමණ වන මුස්ලිම් ජනතාව සමඟ සුහදශීලීව කටයුතු කිරීම ත්‍රස්තවාදය පරාජය කිරීමේ ප්‍රධාන සාධකය බව මතක තබා ගත යුතු බවත්. ඔවුන් තනි නොකර, ත්‍රස්තවාදීන්ගේ පැත්තට තල්ලු කර දැමීමට ඉඩ නොතබා කටයුතු කිරීම අප සැමගේ වගකීමක් බව ද පෙන්නා දුන්නේය. බොහෝ දෙනෙක් නිහඩව සිටින මොරහොතක සමන්පානි මන්ත්‍රිවරිය නායකත්වය ගනිමින් මෙවැනි සභාවක් කැඳවීම අනෙකුත් සියලුම මන්ත්‍රිවරුන්ට ආදර්ශයක් වන බවත් ත්‍රස්තවාදයට බිය වී ගෙවල්තුලට වී නිසොල්මන්ව සිටීම නොව කැඳවා ගත හැකි පිරිස් එක් කර ගෙන රටතුල සිදුවන දේශපාලන ව්‍යසනය පැහැදිලි කර දිය යුතු බවද කියා සිටියේය. මෙම ත්‍රස්තවාදයට මුල්වී ඇත්තේ විදේශීය බටහිර බලවේගයි. එයට පසු බිම සකස් කරනු ලැබුවේ වර්තමාන යූ.ඇන්.පී. ආණ්ඩුවයි. ඡන්ද නොතියා රට ඉදිරියට ගෙන යා නොහැකි අතර බටහිර හමුදා ගෙන්නා ගැනීමට ඇතමුන්ට අවශ්‍යව ඇති බවත්, එය පරාජය කිරීමට සියලු දෙනා එක්සත්ව අත්වැල් බැඳගත යුතු බවත් කියා සිටියේය.

ප්‍රධාන දේශනයෙන් පසුව ප්‍රශ්ණ සඳහා පිලිතුරු සපයා දීමට වාසුදේව මන්ත්‍රිතුමා ඉඩකඩ විවෘත කර දුන් අතර ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමා ඇතුලු මන්ත්‍රිවරුන් රැසක් ප්‍රශ්න විමසමින් සහභාගී වූහ. ස්තුති කථාව කුසුම් පින්නවල සහොදරිය විසින් සිදු කරන ලදී

**වාර්තා කලේ - මුල්ලේරියාවේ උදේශිකා**

# ශක්තිය






ඒකාබද්ධ විපක්ෂයෙන් හා කම්කරු සමිති පෙරමුණෙන් නැගුනු මැයිදන අධිෂ්ඨානය...

# කම්කරු අයිතීන් සුරකිමින් ත්‍රස්තවාදය පරදවමු! මහා මැතිවරණයක් දිනා ගැනීමට සටන් වදිමු!!

අළුත් ත්‍රස්ත පනතකින් දේශපාලන නිදහස ගෙල හිර කොට , විදේශ හමුදා මත යැපෙමින් , කම්කරු අයිතීන් සිදින කම්කරු පනතක්ද සමග ජනතාවගේ ඉඩම් දේශිය හා විදේශිය ධනවතුන්ට අත්පත් කරගත හැකි නව ඉඩම් පනතක්ද, රට බෙදීමට තුඩුදෙන ව්‍යවස්ථාවක්ද, නීතිගත කර ගැනීමට උඩින් සහ යටින් අගමැතිවරයා ඇතුලු UNP කල්ලිය රටේ දැනට පවතින තත්වය උපක්‍රමිකව සියතට ගැනීමට තැත්කරන බව දේශපාලන විචාරකයින්ගේ සැලකිල්ලට ගෙන තිබේ

## බොරුකාර අගමැතිවරයා

බොරුකාර අගමැතිවරයා ත්‍රස්ත ප්‍රහාරය නිසා උත්ගතවී ඇති තත්වය සහ නීතියේ හිදැස් ගැන කල හුවාදැක්වීම ගැන නීති පීඨයේ මහාචාරයවරයෙක් ''ඇයි රනිල් මෙ තරම් බොරු කෙලින්නේ'' යයි ඉංග්‍රීසි ට්විටර් පනිවිඩයක් යවා ඇත. අගමැති දින කිහිපයක් ප්‍රමාදවී වරද පිළිගත්තේ බලයේ තවදුරටත් රැඳී සිටීම විනා බලයෙන් බැහැරව යාමට කිසිදු කැමැත්තකින් නොවේ.

## මැයි දින NM පිළිරුවට අධිෂ්ඨානයේ හරසර

NM සහෝදරයාගේ පිළිරුව අසලට මැයි දින උදේ රැස්වූ කම්කරු සමිති හා වාමාංශික නායකයන් මල් කිනිති තබා NM සහෝදරයාගේ කැපකල දේශපාලනයට උපහාර දැක්වීමෙන් අනතුරුව, රැස්ව සිටි පිරිස කෙටි රැස්වීමක් පවත්වා "සාදුකින් පෙලෙන වුන් දැන් ඉතින් නැගිටියවු... මිහිතලේ අසරණුන් පිබිදියවු" යන ගීතය ගමන් රිද්මයට අනුව ගායනා කරමින් , සටන් පාඨ හඬනගමින් පාර්ලිමේන්තු මාවතේ පෙලපාලියෙන් විපක්ෂ මැයිදින රැස්වීම පැවැත්වූ කෝට්ටේ මහ නගර සභා ශාලාව වෙත වෘත්තිය සමිති පෙරටු කර ගෙන සටන්කාමීව ගමන් ගත්හ.

## දක්ෂිණාංශික තර්ජනයට අධිරාජ්‍ය විරෝධී ජාත්‍යන්තර පිළිතුරක්

අපරට මුහුනපා සිටින බරපතල දක්ෂිනාංශික තර්ජනය ඉදිරියේ අධිරාජ්‍යවාදයට එරෙහිව දකුණු ආසියාව ඇතුල් විවිධ රටවල්හි සටන්වැදී සිටින වැඩකරන ජනතා බලවේගයන් සමග අත්වැල් බැදගනිමින් වසර 133කට පෙර පැය 8 වැඩදිනය වෙනුවෙන් සටන්වැදී , දිවි පිදූ, පිටුවහල් කරණු ලුබූ, සිරගත කරණු ලැබූ වීරයන් සිහිපත් කරමින් කෝට්ටේ නගර ශාලාවේදී වර්තමාන විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ , පස්වන විධායක ජනපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවත් වුනි. එහිදී ඒකාබද්ධ විපක්ෂයේ දේශපාලන පක්ෂ නියෝජිතයෝ මෙන්ම වෘත්තිය සමිති නියෝජිතයෝද මැයි දින යෝජනා ඉදිරිපත් කරමින් කථා පැවැත්වූහ. කොළඹ හා කොළඹ අවට වෘත්තීය සමිති නායකයින් හා වැඩබිම් ප්‍රධානින්, ප්‍රාදේශීය සභා පළාත් සභා මන්ත්‍රිවරුන් හා ඒකාබද්ධ විපක්ෂයේ ක්‍රියාකාරින් රැසක් මෙම මැයිදින රැස්වීමේ කටයුතු සඳහා එක් විය. ප්‍රති ත්‍රස්ත පනත පරාජය කිරීමටත්, වැඩකරන ජනතාවගේ අයිතිය තහවුරු කර දෙන ඉදිරි ආණ්ඩුවක් ගොඩනගන බවත් ප්‍රකාශ වෙමින් රැස්වීමෙ වැඩකටයුතු ආරම්භ වූ අතර, වැඩකරන ජනතාවගේ සමගියට ජයවේවායි කියමින් රැස්වීමේ කටයුතු අවසන් කෙරුණි.




**වියට්නාම් සමාජවාදී ජනරජයේ නිර්මාතෘ හෝචි මිං සහෝදරයාගේ 129 වෙනි උපන්දින සැමරුම වෙනුවෙන් පුෂ්පෝපහාර දැක්වීම අතිගරු පැම් ති බිච් තානාපතිනියගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. මෙම උත්සවයේ කටයුතු වියට්නාම් සහයෝගිතා සංගමයේ ලේකම් එස්.සුදසිංහ සහෝදරයා විසින් සිදු කරන ලදි.**

## ප්‍රතිත්‍රස්ත පනත පොලිස් රාජ්‍යයක මර උගුලක්

-ඒකාබද්ධ වෘත්තීය සමිති මධ්‍යස්ථානය

පසුගියදා එන් එම්. පිලිරුව අභියසදී පැවති මැයිදින සැමරුමේදී ඒකාබද්ධ වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ ප්‍රධාන ලේකම් රංජිත් අතුල සහෝදරයා කථා කරමින් කියා සිටියේ ත්‍රස්තවාදයට මුවා වී ආණ්ඩුව මෙවර ජාත්‍යන්තර මැයි දිනය නොපැවැත්වීමට තීරණය කළත් අප එය නොපිලිගන්නා බවයි. මෙවර මැයි දිනය සියලු දුෂ්කරතා මධ්‍යයේ හැකි පිරිසක් සහභාගී කරවමින් පෙලපාලි දක්වා උද්ඝෝෂණය කර, ජාත්‍යන්තරයේ දිවි දුන් විරුවන්ගේ ධෛර්යෙන් යුතුව අභිමානයෙන් සැමරීමට කටයුතු සූදානම් කර ඇති බව පැවසීය.

තවදුරටත් කථාකරමින් අතුල සහෝදරයා මෙසේද කියා සිටියේය. වැඩකරණ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදි, අවිහිංසාවාදී විරෝධතා ව්‍යාපාර විසුරුවා හැරීමට වතුර ප්‍රහාරයන්, බැටන් පොලු, කඳුලු ගෑස්, වෙඩි උන්ඩයද ඉක්මවා , උද්ඝෝෂකයින්ව ත්‍රස්තවාදීන් ලෙස නම් කරන නව ප්‍රතිත්‍රස්ත පනතක් සම්මත කිරීමට යූ.ඇන්.පී. ආණ්ඩුව සැරසෙන බවත්, ඒකාබද්ධ විපක්ෂය සමඟ එක්ව එය ජීවිත පරිත්‍යාගයෙන් පරාජය කිරීමට වැඩකරන ජනතාව එකාවන්ව පෙල ගැසිය යුතු බවත් කියා සිටියේය.

මෙම රැස්වීමේදී පා.ම. වාසුදේව, කොළඹ නාගරික මන්ත්‍රි මහින්ද කහඳගම, වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ භාණ්ඩාගාරික ජයලත් යන සහෝදරවරුන්ද අදහස් දැක්විය.

**වාර්තා කලේ - ප්‍රේමලාල් පෙරේරා**

කොළඹ 10 ස්ටාර් මුද්‍රනාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.